# කුරුන්දි බෞද්ධ උරුමය




මහාචාර්ය මාලිංග අමරසිංහ

**සංස්කාරක**

**සම්පාදක මණ්ඩලය**

වාසනා ප්‍රේමචන්ද්‍ර

පී. එම්. ආර්. ප්‍රියදර්ශනී

එම්. වී. පී. කල්ප අසංග

රුවන් වින්ඩ්සර්



බෞද්ධාලෝක පදනම

2023

**කුරුන්දි බෞද්ධ උරුමය**

**© බෞද්ධාලෝක පදනම**

ප්‍රථම මුද්‍රණය - **2023**

**ISBN – 978-624-5488-02-5**

රේඛා සිතුවම් - මහාචාර්ය මාලිංග අමරසිංහ

ඡායාරූප - සුමති හෝල්ඩින් මාධ්‍ය අංශය / පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

මනෝජ් මිහිරංග /අනුරාධ විජයවර්ධන බණ්ඩාර

සැලසුම් හා සිතියම් - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**ප්‍රකාශනය**

බෞද්ධාලෝක පදනම

අංක 491

ගාලුපාර, කොළඹ - 03.

දු. අංක 0112352333 / 0114501549

විද්‍යුත් තැපෑල - secretary@bauddhaloka.org

**මුද්‍රණය**

පටුන


| | **පිටු අංක** |
| --- | --- |
| පෙරවදන | 04 |
| සංස්කාරක සටහන | 06 |
| හැඳින්වීම | 07 |
| 1. පරිච්ඡේදය - | |
| භූ භෞතික පසුබිම | 09 |
| ජනගහන ව්‍යාප්තිය | 13 |
| 2. පරිච්ඡේදය - | |
| කුරුන්දි සංඝාරාම සංකීර්ණයේ ඉතිහාසය | 17 |
| 3. පරිච්ඡේදය | |
| වර්තමාන පුරාවිද්‍යාත්මක කටයුතු | 26 |
| 4. පරිච්ඡේදය | |
| සංඝාරාම සංකීර්ණය | 41 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 81 |

# පෙරවදන

කාලයාගේ ඇවෑමෙන් වන වදුලින් වැසී ගිය කුරුන්දි පුදබිම ස්වභාව ධර්මයේ නොයෙක් තාඩන පීඩන හමුවේ වසර දහස් ගණනක් පුරා නොනැසී පැවතෙමින්, මෑත කාලයේ මිනිස් අවධානයට ලක්ව නැවත කළ එළිවෙමින් පවතී.
ජනප්‍රවාද හා ඓතිහාසික මූලාශ්‍රවලට අනුවත් මෙහි කරන ලද පුරාවිද්‍යා පර්යේෂණවලට අනුවත් මෙකී පුදබිම, මෙරට ඉතිහාසයේ අතිශය වැදගත් ආගමික මධ්‍යස්ථානයක්ව තිබූ බව අනාවරණය වෙයි.
බ්‍රිතාන්‍ය පාලනය සමයේ මෙරට විසූ ඉංග්‍රීසි ජාතික රාජ්‍ය නිලධාරීන් වූ හෙන්රි පාකර්, ජේ.පී. ලුවිස් හා එච්.සී.පී. බෙල් වැනි අය කුරුන්දි පුදබිම වෙත ගොස් එහි ඇති වැදගත්කම සිය වාර්තාවන්හි ලියා දක්වා ඇතත්, ඉන් ඔබ්බෙහි වූ වෙනත් පර්යේෂණයක් පිළිබඳව සඳහනක් නොවන අතර ඉන් දශක ගණනාවකට පසු වර්ෂ 1983 දී සිරිල් මැතිව් මහතා මෙම ඓතිහාසික ස්ථානය පිළිබඳව සිය අවධානය යොමු කොට මෙය නැවත මතුකර ගැනීමේ සද්භාවයෙන් ක්‍රියා කර ඇති නමුත් එම අවස්ථාවේ ඇති වූ විරෝධතා හමුවේ එකී කටයුතු නවතා දැමීමට සිදුව ඇත. එතැන් පටන් මෙරට ඇති ව තිබූ දරුණු ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මෙම ප්‍රදේශවලට යාම් ඊම් මුළුමනින්ම නැවතුනෙන් වසර ගණනාවකට පසු යුද්ධය නිමාවීමත් සමග මෙවැනි පුරාවිද්‍යා ස්ථානයක් කෙරෙහි සැදැහැවත් බෞද්ධයන්ගේ අවධානය ද යොමු වෙමින් පැවතිනි. මෙකල පූජ්‍යපාද ගල්ගමුවේ සන්තබෝධි හිමියන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා එක්ව මෙම විහාරයේ පුරාවිද්‍යා කටයුතු සිදු කිරීමට උත්සාහ ගත් අවස්ථාවේ ඇති වු ගැටලුකාරී තත්වයක් හමුවේ නඩු කටයුත්තකට සහයෝගය දීමට මට ද සිදු විය. එවකට මම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපතිවරයා වීමි. එමෙන්ම එකල සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් ආරම්භ කොට තිබූ බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු පුරාවිද්‍යා නිලධාරීන් ඉදිරිපත් කළ සාක්ෂි අනුව උතුරු නැගෙනහිර පලාත්වල වැනසී යන බෞද්ධ උරුමය පිළිබඳව මා තුළ ද මහත් සංවේගයක් ඇති වූ බැවින් එම ප්‍රදේශවල පවතින සුවිශේෂී පුරාවිද්‍යා ස්ථාන කෙරෙහි අවධානය යොමු කොට මතු පරපුර වෙනුවෙන් නැවත නගා සිටුවිය යුතුයැයි සිතට තදින් කා වැදිණ.
විරෝධතා, නඩුහබ ඇතුලු නොයෙක් ගැටලුකාරී තත්වයන් හමුවේ වුවද දැඩි අධිෂ්ඨානයෙන් හා ඉවසීමෙන් යුතුව ක්‍රියා කරමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා එක්ව මෙහි පුරාවිද්‍යා කටයුතු සිදු කරන්නට අවකාශ සැලසුණු අතර මෙම දුෂ්කර කාර්යයේ දී නන් අයුරින් සහය දෙමින් මා වටා සිටි සත් ගුණවත් ශාසනලැදි හිතවතුන් ගේ සහාය මත මෙම භාරදූර කාර්යය හොඳින් අවසන් කරන්නට හැකියාව ලැබිණි. විශේෂයෙන් විවිධ හමුදා කාණ්ඩයන්ගේ සහාය මේ සඳහා නො අඩුව ලැබුණු බව කෘතවේදීව සඳහන් කළ යුතුය.
මා දෙමාපියන්ගෙන් ලද ශාසන ලැදියාවත්, මගේ පාසැල් මෑණියන් වූ කොළඹ ආනන්ද විදුහලෙන් ලද පන්නරයත් මේ අවස්ථාවේදි සිහිපත් කළ යුතුමය. නම් වශයෙන් සඳහන් නොකළ බොහෝ දෙනෙක් මාගේ මෙම ව්‍යායාමය සඳහා නන් අයුරින් දායක වූහ. ඒ සියලු දෙනාටත් කුරුන්දි පුදබිම අලළා සකස් කරන ලද මෙම ග්‍රන්ථය ඉතා මනරම් අයුරින් සම්පාදනය කිරීමට කටයුතු කළ සැමටත්, මාගේ කෘතවේදී ප්‍රණාමය පුද කර සිටිමි.

මෙරට බෞද්ධ ඉතිහාසයේ, කලාවේ මෙන්ම වාස්තුවිද්‍යාවේ ද සන්ධිස්ථානයක් තබමින් යලි පිබිදෙන කුරුන්දි විහාරය බෞද්ධ ජනතාවට වැඳ පුදා ගැනීමටත්, විද්‍යාර්ථීන්ට අධ්‍යයන කටයුතු කිරීම සඳහාත්, සංරක්ෂණය කර තැබීමට හැකිවීම මා ජීවිතයේ ලද මහත් භාග්‍යයක් කොට සලකමි.

මීට ශාසනාභ්‍යාලැති,

ජගත් සුමතිපාල,
සභාපති, බෞද්ධාලෝක පදනම,
උපසභාපති, ලෝක බෞද්ධ සම්මේලනය.

## සංස්කාරක සටහන

**යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං**
**කාලං කරොන්තො අතිදුක්කරානි**
**ඛෙදං ගතො ලොකහිතාය නාථො**
**නමො මහාකාරුණිකස්ස තස්ස**

**ලොකනායක වූ යම් සර්වඥවරයෙක් කප් කෙළ ගණනිදු පමණ නොකට හැකි කලක් මුළුල්ලෙහි අතිශය දුෂ්කර ක්‍රියාවන් කරණුයේ, සත්ත්වලොකයට හිතපිණිස, කායික පරිශ්‍රයට පැමිණියේ ද, මහාකාරුණික වූ ඒ ලොකනායක වූ සර්වඥයන්වහන්සේට මාගේ නමස්කාරය වේවා.**

**- සමන්තපාසාදිකා විනයට්ඨකථා -**

සිරිලක් ඉතිහාසයේ සැඟව ගිය එක් ඉතිහාස පරිච්ඡේදයක් ලෙස කුරුන්දි විහාර වංස කතාව හඳුන්වා දිය හැකිය. නොයෙක් හේතූන් මත සැඟව ගිය ඒ වංස කතාව නැවත වරක් හුදී දනන්ගේ පහන් සංවේගය පිණිසත් ශාස්ත්‍රවන්තයන්ගේ ප්‍රයෝජන පිණිසත් මෙසේ ජනගත කිරීමට හැකි වීම අප ලද භාග්‍යයක් කොට සලකමු.

මේ සුවිසල් කර්තව්‍යය ජාතික මෙහෙවරක් සේ සලකා පැන නැඟි සියලු බාධකයන්හි දී නොපසු බස්නා උත්සහයෙන් කටයුතු කරන ලද බෞද්ධාලෝක පදනමේ ගරු සභාපති ජගත් සුමතිපාල මැතිතුමන්ට ප්‍රථම කොට අපගේ ස්තුතිය පිරිනමමු.

මෙම කටයුතු සඳහා අවසරය ලබා දුන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්තුමා ඇතුලු පුරාවිද්‍යා දෙපාර්තමේතුවටත් අපගේ ප්‍රණාමය මෙයින් පළ කරමු.

මෙම ග්‍රන්ථය මඟින් කුරුන්දි පුද බිම පිළිබඳව පුරාවිද්‍යාත්මක කරුණු නිවැරදිව වාර්තා කිරීම, ඉදිරි පුරාවිද්‍යා කටයුතු සඳහා පිටුවහලක් ලැබෙයැයි විශ්වාස කරන අතර ඒවා වඩාත් තහවුරු කිරීම පිණිස සැලසුම්, ඡායාරූප ආදිය ද ඇතුළත් කරන ලදී.

එමෙන්ම මෙම පුරාවිද්‍යා භූමියේ සැබෑ තතු ප්‍රකෘති ආකාරයෙන් ලක්වැසි සියලු ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මෙම ග්‍රන්ථයේ ඉංග්‍රිසි සහ දෙමළ පරිවර්තන ද මේ සමඟම එළිදක්වන අතර එම පරිවර්තන කටයුතු සිදු කළ ආචාර්ය බුද්ධිනී විජේසූරිය මහත්මියටත්, කථිකාචාර්ය නාගරත්නම් සුදර්ශිනී මෙනෙවියටත් තුති පුදමු. පරිවර්තනයන්හි සෝදුපත් කියවූ ආචාර්ය මඩුලුගිරියේ විජේරත්න මහත්මාටත්, මෙම ග්‍රන්ථය සකස් කිරීම සඳහා උපදෙස් ලබා දුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන හා නාණක විද්‍යා අංශයේ හිටපු අධ්‍යක්ෂිකා ආචාර්ය මාලිනී ඩයස් මහත්මියටත් ස්තුතිවන්ත වන අතර කුරුඳුමලේ ශිලා ලේඛනය කියවා එහි අර්ථගැන්වීම ද එම මහත්මිය විසින් සිදු කිරීම සම්බන්ධයෙන් ද. බොහෝ ලේඛන සපයා දෙමින් උපකාර කළ පානි වැවල මහතාට ද මේ මොහොතේ දී අපගේ කෘතඥතාව පල කළ යුතුමය.

මෙම කර්තව්‍යය සඳහා දායක වූ සියලු ශාස්ත්‍රවන්තයන් වෙත සහ බෞද්ධාලෝක පදනමේ කාර්ය මණ්ඩලයට අවසාන වශයෙන් තුති පුදමු.

මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් පුරාවිද්‍යා උරුමය සුරැකීමට ඔබ සැමට නැණ නුවණ පහළ වේවායි අපි ප්‍රාර්ථනා කරමු.

සංස්කාරක

මහාචාර්ය මාලිංග අමරසිංහ

# හැඳින්වීම

මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කුරුන්දි විහාරය ලංකාවේ දක්නට ලැබෙන පුරාවිද්‍යා ස්ථානයන්ගෙන් සුවිශේෂී ස්ථානයකි. මෙරට හමුවන පද්මාකාර එකම දාගැබ මෙය වේ. එපමණක් නොව මහාවංසයට අනුව කුරුන්දචුල්ලක නම් පිරිවෙණ ලෙසත් (මහාවංසය 33, 32), IV අග්ගබෝධි රජුගේ (සම්මත වර්ෂ 667-683) අවධියෙහිදී කුරුන්දපිල්ලක විහාරය ලෙසත් (මහාවංසය 44, 21), අට්ඨකථාවන්හි කුරුන්දපාසක විහාරය ලෙසත්, IV උදය රජ (සම්මත වර්ෂ 946-954) කාලයේදී සංඝාරාම සිරිසඟබෝ රජමහා විහාරය ලෙසත් හඳුන්වා ඇති බව එම ස්ථානයෙන් අනාවරණය වූ ශිලා ලිපිය මගින් තහවුරු වෙයි. එම සෙල්ලිපියට අනුව මෙහි අභය ඉසිරිපව් නම් පියංගලක් හෙවත් පධානඝරයක් ද තිබූ බවට ද සාධක අනාවරණය වේ **(***Inscriptions of Ceylon*, Volume V, Part II:221-224**).** පළමුවන විජයබාහු රාජ්‍ය (සම්මත වර්ෂ 1055-1110) සමයේදී කුරුන්දිය විහාරය (ලංකා විශ්වවිද්‍යාලය 1 කාණ්ඩය II භාගයː 409) නමින් ද ව්‍යවහාරව පැවැති බව සනාථ වේ. වර්තමානයේ මෙය කුරුන්දි විහාරය, කුරුන්දාවශෝක විහාරය (මැතිව් 1981ː44) ආදී වශයෙන් හඳුන්වා ඇත.

මෙම විහාරය දශක ගණනාවක් මුළුල්ලේ මහ වනයේ සැඟව පැවතියේය. විවිධ අවස්ථාවලදී නිදන් ගැනීමේ අරමුණෙන් ගොස් විනාශකාරී ක්‍රියාවල නිරතවූවන්, ආගමික වශයෙන් විවිධ මත දරන්නන්ගේ ග්‍රහණයට ලක්වීම්වලින් විනාශ වීම් හා නන් අයුරින් අතීතය සොයා යන්නන්ගේ අවධානයට ලක්වෙමින් පැවති මෙම පුරාවිද්‍යා ස්ථානයට නැවුම් කාලපරිච්ඡේදයක් උදා වී ඇත. උතුරු පළාතේ පිහිටි වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස අතීතයේ සිට පැවත ආ කුරුන්දි විහාරය නැවත පණ ගැන්වීමට බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතා ඇතුලු පිරිස ඉදිරිපත් විය. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය, උපදේශකත්වය හා ශාස්ත්‍රීය දායකත්වය සහිතව බෞද්ධාලෝක පදනමේ මූල්‍යමය අනුග්‍රහයෙන් මෙහි පුරාවිද්‍යා කටයුතු සිදු වෙමින් පවතී. මෙමගින් ශ්‍රී ලාංකීය ඉතිහාසයට නව පිටුවක් එක් කළ හැකි වූ කරුණු රාශියක් අනාවරණය කර ගත් අතර ඉදිරියේ දී තවත් කරුණු රාශියක් අනාවරණය කර ගත හැකි වේ යැයි අපේක්ෂා කෙරේ. මෙහි කටයුතු සිදු කර ගැනීමේ දී ගල්ගමුවේ සන්තබෝධි නාහිමියන්ගේ ආශිර්වාදයත්, සිවිල් ආරක්ෂක බලකායේ හා යුධ හමුදාවේ දායකත්වය ලැබීමත් භාග්‍යයක් කොට සැලකිය හැකිය. කුරුන්දි විහාරයේ ඓතිහාසිකත්වය මෙන්ම මෙතෙක් එහි සිදු කරන ලද පර්යේෂණ අළලා වූ තොරතුරු ද ඇතුලත්ව මෙම ග්‍රන්ථය සම්පාදනය කරණු ලැබුවේ බෞද්ධාලෝක පදනම මගිනි. මෙම ග්‍රන්ථය දොරට වඩිනු ලබන්නේ කුරුන්දි ස්තූපය සංරක්ෂණය කර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාර දීම සනිටුහන් කිරීම් වස් බෞද්ධාලෝක පදනමේ ප්‍රකාශයක් ලෙසිනි.

## පිදුම

## ආචාර්ය මිලිනා සුමතිපාල මැතිණියගේ නාමයට

# 1 පරිච්ඡේදය

## භූ භෞතික පසුබිම

මුලතිව් දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ඊශාන දෙසින් පිහිටා ඇති අතර එය වර්ග කිලෝමීටර් 2693 ක භූමි ප්‍රමාණයකින් යුක්ත වේ (Statistical Hand Book 2021:1). මෙම ප්‍රදේශය ත්‍රිකුණාමලය, වව්නියාව සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්ගෙන් සීමා වී ඇත. මුලතිව් දිස්ත්‍රික්කයේ නයාරු කලපුව හරහා පහළ ප්‍රදේශයට ගලා බස්නා මනල් ආරුව ආශ්‍රිතව කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය පිහිටා තිබේ.

අතීතයේ පැවති දේශපාලනික හෝ පරිපාලනමය බෙදීම් අනුව දිවයින ප්‍රධාන කොටස් තුනකට බෙදී පැවති අතර එය  රුහුණු රට, පිහිටි රට, මායා රට වශයෙන් හඳුන්වා තිබේ. එම පැරණි බෙදීම් අනුව මෙම ප්‍රදේශය පිහිටි රටට අයත්ව පැවත ඇත.

ව්‍යවහාර වර්ෂ දෙවන සියවසට අයත් ටොලමිගේ ලංකා සිතියමෙහි "නාගදීපය" නමින් ලකුණු කර ඇති පෙදෙසෙහි වර්තමාන  වවුනියා දිස්ත්‍රික්කය පිහිටියේය. එම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති හතරවන සියවසට අයත් තෝනිගල සෙල්ලිපියෙහි එම ප්‍රදේශය "උතුරුපස" ලෙස හඳුන්වා ඇත (Epigraphia Zeylanica III:172–188). අනුරාධපුර යුගයේ දී මෙය  පතිට්ඨාරට්ඨ  (පිහිටි රට)  ලෙස හැඳින් වූ උත්තරපස්ස, උත්තරදේශ, උත්තරරට්ඨ, උතුර්පස හා උතුරුකර කරා යන නම් වලින් හැඳින් වූ අනුරාධපුර අගනුවර කරගත් රජ රට ට අයත් ව ලංකාවේ උතුරු පෙදෙස් වව්නියා දිස්ත්‍රික්කය පිහිටියේය (වීරසිංහ 1985 : 11)

"කුරුඳුගමු රට" නමින් ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම්පොතේ සඳහන් වන්නේ වංශකතාවේ එන "කුරුන්දිරට්ඨය" විය හැකි බවද  සඳහන්වේ (අභයවර්ධන 1978 : 96).

පැරණි බෙදීම් අනුව මෙම කලාපය වන්නි ප්‍රදේශයට අයත්ව පැවති අතර එම ප්‍රදේශය උතුරින් යාපනයෙන් හා දකුණින් අරුවි ගඟෙන් මායිම් ව තිබී ඇත. වව්නියාව දිස්ත්‍රික්කය වන්නියේ දකුණු අර්ධය වන අතර මුලතිව් දිස්ත්‍රික්කය එහි උතුරු අර්ධය වශයෙන් හඳුන්වා ඇත. ලන්දේසීන් විසින් වන්නි ප්‍රදේශයේ භූමිය එවකට ගණනය කර පැවති අතර එය වර්ග කිලෝමීටර් 1864 පමණ වන බවත් මුලතිව් දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර් 927 ක් ලෙසත් සඳහන් කර ඇත (Lewis J.P 1895:1).




19 වන සියවසේදී වන්නිය දැක්වෙන සිතියම උපුටා ගැනීම J.P. Lewis, 1895 : 1


ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප කිහිපයක් දක්නට ලැබෙන අතර මෙම ප්‍රදේශය අයත් වන්නේ උතුරු දිග වෙරළ තැනිබිම් කලාපයටය (ගුණසේන ශ්‍රී ලංකා සිතියම් පොත නව සංස්කරණය 2018 ፡ 26, 30, 32). වඩා පුළුල් රැළිවලින් හා වගුරු බිම්වලින් යුක්ත වන අතර රට අභ්‍යන්තරයට කා වැදුනු මුහුදු ප්‍රදේශවලින් ද සමන්විතය. භූ රූපක විද්‍යාත්මක කලාප අනුව වෙරළ, වැටි, අවුරු හා තුඩු ලක්ෂණවලින් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ භූමිය පිළිබඳව සැළකිමේදී භූමියෙන් වැඩි කොටසක් නිර්මාණය වී ඇත්තේ ප්‍රාග් කේම්බ්‍රීය අවධියේදීය. ඒ අනුව බලන කළ ලංකාව පෘථිවියේ පැරණිතම භූ ස්කන්ධවලින් කොටසකි. ශ්‍රී ලංකාවේ භූමිය නිර්මාණය වී ඇති පාෂාණ හා ඛනිජ වර්ග ව්‍යාප්තිය සැලකිල්ලට ගැනීමේ දී මුලතිව් දිස්ත්‍රික්කය අයත් වන්නේ මයෝසීන

යුගයේ පාෂාණ ශේෂ සහිත ප්‍රදේශයටය. එහි ඛණිජ ව්‍යාප්තිය බොරළු තරමක් යමුසු ස්වරූපයකින් ද යුක්ත වේ. පාංශු ව්‍යාප්තිය සළකා බැලීමේ දී එය මෑත කාලීන වැල්ලෙහි සහ වැලි වැටිවල ඇති රෙගොසොල්ලස් සමතලා භූමි වර්ගයට අයත් වේ.

ඊශාන දිග හා නිරිත දිග මෝසම් මගින් ප්‍රදේශයට වාර්ෂික වර්ෂාපතනය ලැබෙන අතර ඊශාන දිග මෝසම (නොවැම්බර් - මාර්තු) මගින් මිලි මීටර් 250-500 අතර වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ. නිරිත දිග මෝසම (මැයි - සැප්තැම්බර්) මඟින් එය මිලිමීටර් 1000-1500 අතර ප්‍රමාණයකින් යුක්ත වේ. මධ්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 27.5 පමණ වේ. උෂ්ණත්වය, වර්ෂාපතනය යන සාධක සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප වෙන් කිරීමට අනුව මෙම ප්‍රදේශය පහත රට වියළි කලාපයට අයත් වේ. වාර්ෂික නියං උපද්‍රව සම්භාවිතාව ගත් කළ ප්‍රදේශය තුළ යල, මහ කන්න දෙකේදී ම 10% - 20% අතර ප්‍රමාණයක් වන අතර වර්ෂයකට සාමාන්‍ය වියළි කාලගුණය මාස 2-3 අතර කාලයක් වේ.

ශ්‍රී ලංකාව වනාන්තර වර්ගීකරණය යටතේ ප්‍රධාන කලාප තුනකට වෙන් කර ඇත. මෙම වර්ගීකරණයට අනුව මුලතිව් දිස්ත්‍රික්කය අයත් වන්නේ වියළි කලාප වනාන්තර ගණයට ය. මුලතිව් දිස්ත්‍රික්කයේ මුළු වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 169,305,5 කි (2012 වර්ෂයට අදාළ දත්ත අනුව, ගුණසේන ශ්‍රී ලංකා සිතියම් පොත 2018 : 34).

Kurundi Archaeological Site (One Inch)




කුරුන්දි විහාරයේ පිහිටීම

ප්‍රදේශයේ ජීවනෝපාය මාර්ග කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය මත පදනම් ව ඇත. අතීතයේ සිට ම වී වගාව පැවත ඇති බවට සාධක දක්නට තිබේ. ඊශාන දිග මෝසම මඟින් වගා කටයුතු සඳහා ජලය ලබාගෙන ඇති අතර ප්‍රධාන වැව් 4 ක් සහ මධ්‍යම ප්‍රමාණයේ වැව් 17 ක් හා කුඩා ප්‍රමාණයේ වැව් 409 ක් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සැපයුම සිදු කර ඇත. මෙම ප්‍රදේශයේ වෙරළ තීරය කිලෝමීටර් හැත්තෑවක් පමණ වන අතර ඊට සමගාමී වන අයුරින් නයාරු, මාතලන්, නන්දිකඩාල්, කෝකිලායි කලපු පිහිටා තිබේ. එම පිහිටීම මසුන් ඇල්ලීම සඳහා ඉතා යෝග්‍ය වන අතර ඉස්සන්, කකුළුවන් සඳහා ප්‍රසිද්ධ ව ඇත. (Statistcal Hand Book 2021:3,5).

පරිපාලනමය ව්‍යුහය සාකච්ඡා කිරීමේ දී 1833 වර්ෂයේ කෝල්බෘක් ප්‍රතිසංස්කරණ යටතේ සමස්ත දිවයින සඳහාම එක් පරිපාලන ක්‍රමයක් ඇති කෙරිණි. මෙම ප්‍රතිසංස්කරණයෙන් පසුව දිවයින පළමු වරට පළාත් පහකට බෙදා වෙන් කෙරුණු අතර එය දකුණ, බස්නාහිර, උතුර, මධ්‍යම සහ නැගෙනහිර වශයෙන් නම් කර ඇත. මෙම පළාත් පහට අදාළ ව සෑම දිස්ත්‍රික්කයක් තුළ ම මෙරටට ආවේණික පරිපාලන ධූරාවලියක් ඇති කරණු ලැබීය. වර්ෂ 1889 දි මෙම පළාත් බෙදීම පළාත් නවය දක්වා වර්ධනය කරණු ලැබිණි. ඒ අතරට උතුරු පළාත ද ඇතුළත්ය (ගුණසේන සිතියම් පොත නව සංස්කරණය 2018:48).

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි වසම් යන අංගයන්ගෙන් සමන්විත වේ. ඒ අනුව උතුරු පළාත වන්නි, යාපනය, මන්නාරම යන දිස්ත්‍රික්කයන්ගෙන් සමන්විත විය. වන්නි දිස්ත්‍රික්කය පසුව මුලතිව් දිස්ත්‍රික්කය හා වව්නියාව දිස්ත්‍රික්කය ලෙස කොටස් දෙකක් ලෙස නම් කර ඇත. වර්තමානය වන විට උතුරු පළාත ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්ක පහක් යටතේ ක්‍රියාත්මක වේ (මුලතිව් දිස්ත්‍රික්කය 1979 වර්ෂයේ දී අලුතින් එක් කරන ලද දිස්ත්‍රික්කවලින් එකකි).

උතුරු ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරි වසම සමඟ භූමි ප්‍රමාණය.

| **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස** | **ග්‍රාමනිළධාරී වසම්** | **භූමි ප්‍රමාණය (වර්ග කි.මී.)** |
|---|---|---|---|
| මුලතිව් | 06 | 136 | 2,693 |
| මන්නාරම | 05 | 153 | 1,996 |
| වව්නියාව | 04 | 102 | 1,891 |
| යාපනය | 15 | 435 | 1,025 |
| කිලිනොච්චිය | 04 | 95 | 1,279 |

මුලතිව් දිස්ත්‍රික්කයට අයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06

- ❖ තුනුක්කායි
- ❖ මාන්තායි නැගෙනහිර
- ❖ පුතුකුඩිඉරිප්පු
- ❖ ඔඩ්ඩුසුඩාන්
- ❖ මුහුදුබඩ පත්තුව
- ❖ වැලිඔය (Statistical Pocket Book 2021:6)

වර්තමාන බෙදීම් අනුව කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. අතීතයේදී එම ප්‍රදේශය කරික්කාඩුමුල්ලෙ දකුණ ලෙස සඳහන් ව ඇත.

## ජනගහන ව්‍යාප්තිය

පැරණි බෙදීම් අනුව කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය අයත් වන මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව 1817 - 1891 දක්වා ජනගහන ව්‍යාප්තිය (Lewis J.P, 1895:46).

| **කොට්ඨාස** | **1817** | **1839** | **1871** | **1881** | **1891** |
|---|---|---|---|---|---|
| **කරික්කඩ්ඩමුල්ලෙ උතුර** | **1233** | **1751** | **2636** | **2922** | **2810** |
| කරික්කඩ්ඩමුල්ලෙ දකුණ | 539 | 589 | 858 | 745 | 1002 |
| මුල්ලියාවේලෙ | 750 | 833 | 1098 | 1209 | 1041 |
| පුතුකුඩුඉරිප්පු 6 | 1106 | 1138 | 1523 | 1348 | 1194 |
| කරුනයාල්පත්තු උතුර | 302 | - | - | - | - |
| කරුනයාල්පත්තු දකුණ | 633 | 528 | 443 | 387 | 331 |
| තුණුක්කායි 7 | 539 | 517 | 390 | 390 | 538 |
| මෙයිපත්තු උතුර | 598 | 862 | 798 | 636 | 606 |

ප්‍රධාන ආගමික ඇදහීම් අනුව ජනගහන ව්‍යාප්තිය 1881 සිට 1891 දක්වා (Lewis J.P 1895:92).

| **දිස්ත්‍රික්කය** | **ලිංග බේදය** | **හින්දු** | **බෞද්ධ** | **මොහමදීන්** | **ක්‍රිස්තියන්** |
|---|---|---|---|---|---|
| | | 1881 - 1891 | 1881 - 1891 | 1881 - 1891 | 1881 - 1891 |
| වව්නියා | පිරිමි | 68 - 66 | 12 - 13 | 9 - 9 | 11 - 11 |
| මුලතිව් | පිරිමි | 81 - 80 | | 5 - 6 | 14 - 14 |
| වව්නියා | කාන්තා | 66 - 68 | 13 - 15 | 9 - 9 | 11 - 10 |
| මුලතිව් | කාන්තා | 81 - 79 | | 6 - 6 | 13 - 5 |

පැරණි බෙදීම් අනුව කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය අයත් ප්‍රදේශය කරික්කාඩුමුල්ලෙයි දකුණ වන අතර එම ප්‍රදේශයේ ගම්මාන දහඅටක් පැවත ඇති අතර එම ප්‍රදේශ ආශ්‍රිත ජනගහන ව්‍යාප්තිය පහත පරිදි වේ (Lewis J.P, 1895:76).

**කරික්කඩ්ඩමුල්ලෙයි දකුණ**

| | **1817** | **1839** | **1881** | **1891** |
|---|---|---|---|---|
| අලම්පිල් | 71 | 44 | 71 | 94 |
| ආන්දම්කුලම් | 22 | 62 | 52 | 71 |
| චෙම්නලයි | 41 | 42 | 80 | 99 |
| චිවන්තම්පුරයිප්පු | - | - | - | - |
| ඉරම්මියන්කුලම් | 3 | - | - | - |
| කඩ්ඩුත්තාඩ්ඩාමලෙයි | - | - | - | - |
| කනකනායන්කුඩිඉරිප්පු | 27 | - | - | - |
| කරදිප්පුවල් | 10 | - | - | - |
| කරුවඩ්ඩුකේනී | 44 | 66 | 109 | 60<br>147 |
| කෝකිලායි | - | - | - | - |
| කොඩ්ඩායිපානික්කාඩු | - | 71 | 182 | 147 |
| කොක්කුඩුවායි | 78 | 107 | 239 | 361 |
| කොමලමුනෙයි | 108 | - | - | - |
| කුන්චිකුලම් | 28 | | | |
| තඩ්ඩායිමලෙයි | 56 | 90 | 12 | 23 |
| තුවරාන්කරයි | 24 | - | - | - |
| තුවරාන්කුලම් | 15 | - | - | - |
| වෙප්පන්කුලම් | 12 | - | - | - |
| | **539** | **482** | **745** | **1,002** |

මුලතිව් දිස්ත්‍රික්කය තුළ ජනගහන ව්‍යාප්තිය ජාතීන් අනුව 1953-2012 දක්වා (Statistical Pocket Book 2021:9).

කුරුන්දි පුරාවිද්‍යා භූමිය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජාතීන් අනුව ජනගහන ව්‍යාප්තිය ප්‍රතිශතයක් ලෙස (Statistcal Hand Book 2021:34).

| සිංහල | ශ්‍රී ලාංකික ද්‍රවිඩ | ඉන්දියානු ද්‍රවිඩ | ශ්‍රී ලාංකික මුස්ලිම් | එකතුව |
|---|---|---|---|---|
| 3.53% | 89.82% | 0.53% | 5.96 | 0.16 |

මුලතිව් දිස්ත්‍රික්කය තුළ ආගමික ව්‍යාප්තිය 1953 සිට 2012 (Statistical Pocket Book 2021:34).

| ආගම් | 1953 | 1963 | 1971 | 1981 | 2001 | 2012 |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ | 5209.4 | 7003.3 | 8536.9 | 10288.3 | 12986.6 | 14272.1 |
| හින්දු | 1610.5 | 1958.4 | 2238.7 | 2297.8 | 1312.9 | 2561.3 |
| ඉස්ලාම් | 541.5 | 724.0 | 901.8 | 1121.7 | 1435.9 | 1967.5 |
| රෝමානු කතෝලික | 724.4 | 884.9 | 1004.3 | 1130.6 | 1185.9 | 1552.2 |
| වෙනත් | 11.9 | 11.4 | 8.3 | 8.3 | 8.4 | 6.4 |

කුරුන්දි පුරාවිද්‍යා භූමිය අයත් මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආගම් අනුව ජනගහන ව්‍යාප්තිය ප්‍රතිශතයක් ලෙස (Statistcal Hand Book 2021:35).

| බෞද්ධ | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | වෙනත් කතෝලික | වෙනත් |
|---|---|---|---|---|---|
| 1.01% | 72.33% | 6.17% | 17.48% | 2.93% | 0.08% |


මුලතිව් දිස්ත්‍රික්කය තුළ ජනගහන ව්‍යාප්තිය ජාතීන් අනුව 1953-2012 දක්වා (Statistical Pocket Book 2021:9).

| ජන වර්ග | **1953** | **1963** | **1971** | **1981** | **2001** | **2012** |
|---|---|---|---|---|---|---|
| මුළු ජනගහනය | 8,098 | 10,582 | 12,690 | 14,847 | 16,930 | 20,359 |
| සිංහල | 5617 | 7,513 | 9,131 | 10,980 | 13,876 | 15,250 |
| ශ්‍රී ලාංකික ද්‍රවිඩ | 885 | 1,165 | 1,424 | 1,887 | 7,32 | 2, 269 |
| ඉන්දියානු ද්‍රවිඩ | 974 | 1,123 | 1,175 | 819 | 855 | 840 |
| ශ්‍රී ලාංකික මුස්ලිම් | 464 | 627 | 828 | 1,047 | 1339 | 1893 |
| ඉන්දියානු මුස්ලිම් | 48 | 55 | 27 | - | - | - |
| යුරෝපියානුවන් | 7 | | | | | |
| බර්ගර් සහ යුරේසියානු | 46 | 46 | 45 | 39 | 35 | 38 |
| මැලේ | 25 | 33 | 43 | 47 | 55 | 44 |
| වැදි | 1 | - | -- | - | - | - |
| ශ්‍රී ලාංකික චෙට්ටි | - | - | - | - | - | 6 |
| භාරත | - | - | - | - | - | 2 |
| වෙනත් | 32 | 21 | 16 | 28 | 37 | 18 |

යටත්විජිත පාලන සමය වන විට ඉහතින් ඉදිරිපත් කර ඇති දත්ත මගින් මෙම ප්‍රදේශයේ විවිධ ජාතීන් හා ආගම් නියෝජනය කරණ පිරිස් එවකට වාසය කර ඇති බව තහවුරු වේ.

1891 වර්ෂයේ වව්නියා හා මුලතිව් ආශ්‍රිත ප්‍රදේශයේ මැලේ ජාතිකයින් හත් දෙනෙකු, ඇෆ්ගන් ජාතිකයන් හතර දෙනෙක් ද කෆීර් ජාතිකයෙක් සහ පාතියන්වරුන් තිදෙනෙක් ආදි වශයෙන් ද වාසය කර ඇත (Lewis J.P, 1895:81). ඈත අතීතයේ සිටම මෙම ප්‍රදේශය ආශ්‍රිතව විදේශීය වෙළඳ මධ්‍යස්ථානයක් පැවති බවට මෙය අනගි නිදසුනකි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කළ උතුරු පළාතේ පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය තුළින් මුලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන 176 ක් අනාවරණය කර ගෙන තිබේ. ඒ අනුව අනුරාධපුර යුගයේ මෙම ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක පැතිරිම සලකා බැලූ කල විශාල ජනගහනයක් සිටි බව නිගමනය කළ හැකිය.




මුලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන

## 2. පරිච්ඡේදය

# කුරුන්දි සංඝාරාම සංකීර්ණයේ ඉතිහාසය

මුලතිව් දිස්ත්‍රික්කයේ ඇති සංඝාරාම අතර කුරුන්දි විහාරය සුවිශේෂී සංඝාරාමයක් ලෙස හඳුන්වා දිය හැකිය. බුදුරජාණන් වහන්සේගේ දෙවැනි ලංකාගමනයෙහි දී මෙම ස්ථානයට වැඩි බව ජනප්‍රවාදගත පිළිගැනීම වේ. (Parker H, 1886:449 ; Lewis J.P, 1895: 10-311). මෙම විහාරය බල්ලාටනාග රජු (සම්මත වර්ෂ පෙර 110-103) විසින් ඉදිකළ බවට, වංශකතා හා අට්ඨකථාවන්හි සඳහන් කුරුන්දපාසක විහාරය බව පැහැදිලි කරගත හැකි ය. කුරුන්දවුල්ලක නම් පිරිවෙණක් එහි වූ බව ද එහි සඳහන් වෙයි (මහාවංසය 33, 32). කුරුන්දි අට්ඨකථාව පිළිබඳව තොරතුරු සමන්තපාසාදිකාවිනය අටුවාවේ සඳහන් වේ (විමති විනෝදනීනාම සමන්තපාසාදිකාය විනයට්ඨකථාය ටීකා:1935)[1]. සම්මත වර්ෂ පෙර 268 රාජ්‍යයට පත් ධර්මාශෝක අධිරාජයාගේ සමයේ පාඨලීපුත්‍රයේ දී මෙසේ තෙවැනි ධර්ම සංගායනාව සිදු වූයේ මොග්ගලීපුත්තතිස්ස තෙරුන් වහන්සේගේ ප්‍රධානත්වයෙනි. එහි දී සංග්‍රහ කළ නිවැරදි ත්‍රිපිටකය සහ පාලි අටුවා මිහිඳු මහ රහතන් වහන්සේ විසින් සම්මත වර්ෂ පෙර 250 දී ලංකාවට ගෙන එන ලදී. පාලි අටුවා මහින්ද මහරහතන් වහන්සේ විසින් සිංහල භික්ෂූන් සඳහා ස්වකීය භාෂාවට ලියා උගන්වා ඇත. එසේ ලියන ලද ඒවා හෙළ අටුවා ලෙස හැඳින්විය හැකිය. හෙළ අටුවාවන් නැවත මහාවිහාරයේ ග්‍රන්ථාකර පිරිවෙනේ වෙසෙන රහතුන් වහන්සේලාගේ අධීක්ෂණය යටතේ බුද්ධඝෝෂ හිමියන් මහා විහාරවාසී බුද්ධසිරි හිමිගේ ආරාධනයෙන් කළ බව ද සඳහන්ය. බුද්ධඝෝස හිමි සමන්තපාසාදිකාවෙහි හැඳින්වීම වන බාහිරනිධානවර්ණනාවේ සඳහන් කරණුයේ අට්ඨකථා පාලියට නැගීමට ආරාධනා කළේ මහාවිහාර වාසී බුද්ධසිරි තෙරුන් විසින් බවයි (Dias Malini, 2019:8). බුද්ධඝෝස හිමියන් විසින් කරන ලද අටුවාවන්ට ආශ්‍රය වී ඇත්තේ මහාඅට්ඨකථා, මහාපච්චරියඅට්ඨකථා, කුරුන්දිට්ඨකථා, යන මේ හෙළ අටුවා වේ. ප්‍රධාන අට්ඨ කතාවක් වන "කුරුන්දි අට්ඨ කථාව" සම්පාදනය කරන ලද්දේ කුරුන්දි විහාරයේ දී බව සාහිත්‍ය කෘතිවල සඳහන් වේ. ඒ පිළිබඳව පී. වීරසිංහ මෙසේ සඳහන් කරයි. "මිහිඳු හිමියෝ දීප වාසීන්ගේ යහපත සඳහා අට්ඨකථා, හෙළ බසින් ලියා තැබූහ. මූල හෙවත් මහ අට්ඨකතාව, මහා පච්චරිය හා කුරුන්දිය සිංහල අට්ඨ කථාවෝය. මින් කුරුන්දි අට්ඨ කථාව හිමිව තිබූ බෞද්ධ මධ්‍යස්ථානය මුලතිව්

[1] කුරුන්දිවෙල්ලි විහාරෝ නාම අත්ථි, තත්ථ කතත්තා "කුරුන්දි" ති නාමං ජාතන්ති වදන්ති: 5

දිස්ත්‍රික්කයේ පිහිටි බෞද්ධ නටබුන් බහුල කුරුන්දන් මලය නැමැති ස්ථානය ලෙස අදහස් කරනු ලැබේ (වීරසිංහ. පී, 1985:47).” I අග්ගබෝධි රජු (සම්මත වර්ෂ 571-604) විසින් කුරුන්දි විහාරය තනවන ලද බවත්, ඒ අවට යොදුන් තුනක් පමණ පළලට පොල්වත්තක් වවන ලද බවත් සඳහන් වේ (මහාවංසය 41,16; Rahula Walpola, 1956:240). තවද වංශකතාවන්ට අනුව මෙම ප්‍රදේශය කුරුන්දි වාපී මෙවත් කුරුඳු වැව නමින් හඳුන්වා ඇත. පළමු වන අග්ගබෝධි රජු කරවූ කුරුන්දවාපිය හෙවත් කුරුඳු වැව නම්, "කුරුන්තන් ඌර්" නමින් ප්‍රකට පුරාණ කුරුන්දි විහාරයේ නටබුන්වලට තරමක් දුරින් පිහිටි විශාල වැව ලෙස පිළිගත හැකිය. මෙය දැනට තණ්ණිමුරිප්පුකුළම් නමින් හඳුන්වනු ලබයි. මනල් ආරුවේ ජලයෙන් මෙම වැව පෝෂණය වේ (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1964:340). මෙම ප්‍රදේශය තුළ සිංහලයන් විසින් ඉදිකරන ලද ලොකු කුඩා අත්හැර දමන ලද වැව් විශාල සංඛ්‍යාවක් දක්නට ඇති බව ජේ. පී. ලුවිස් මහතාගේ වාර්තාවේ සඳහන් වේ. ඒ අතරින් කුරුන්දි වැව හා තන්නිමුරිප්පු වැව ප්‍රධාන වන බව ඔහු පවසා ඇත. එච්. පාකර්ගේ වාර්තාවන්ට අනුව තන්නිමුරිප්පු වැව හා කුරුන්දි වැව පිහිටා ඇත්තේ නයාරු නිම්නය තුළ ය (Nicholas C.W, 1959: 86-87).[2]

IV වන අග්ගබෝධි රජු (සම්මත වර්ෂ 667 - 683) කාලයේ ඇමතිවරයෙකු විසින් කුරුන්දපිල්ලක විහාරයෙහි ප්‍රාසාදයක් කරවූ බව සඳහන් වෙයි (මහාවංසය 44, 21). I වන විජයබාහු රජු (සම්මත වර්ෂ 1055-1110) කුරුන්දිය විහාරය නැවත කර වූ බව ද කියැවේ (ලංකා විශ්වවිද්‍යාලය 1 කාණ්ඩය II භාගයː 409). දෙවන පරාක්‍රමබාහු රජුගේ (ව්‍ය.ව.1236-1270) පාලන අවධියේ කාලිංස මාඝ සහ ජයබාහු නම් ද්‍රවිඩ රජවරුන් සහ ඔවුන්ගේ හතලිස්දහසක් වන සේනාව විසින් බඳින ලද කඳවුරු පහළොව අතරට කුරුන්දියත් අයත් විය. බලහත්කාරයෙන් බඳින ලද කඳවුරු දෙවන පරාක්‍රමබාහු රජුගේ සේනාව විසින් මුදාගත් බව මහාවංශයෙහි දැක්වේ (මහාවංසය 83, 16-32). මාඝගේ හා ඔහුගේ සහායක ජයබාහුගේ බලකොටු පිහිටා තිබුණේ පුළත්ථිපුර (පොළොන්නරුව), ...... කුරුන්දි (කුරුඳු) ...... යනාදී ස්ථානවලය. මේ බව වංසකථා ද, පූජාවලිය සහ නිකාය සංග්‍රහය යන ග්‍රන්ථවල ද සඳහන් වේ. එකල පෙර මහා යුද්ධ කොට (පැරද) පලා ගිය චන්ද්‍රභානු රජ පාණ්ඩ්‍ය චෝළ ආදී රටවලින් බොහෝ දමිළ යෝධයන් එක් රැස් කොට බලසම්පන්නව, ජාවක සේනාව කැටුව මාවටු තොටින් ගොඩ බැස්සේ ය. පදී, කුරුන්දි යනාදී ප්‍රදේශවල විසූ සිංහලයන් සිය වසඟයට ගත් රජ, සුභපබ්බතයට (යාපහුව) ගොස් එහි කඳවුරු බැඳ... (මහාවංසය

[2] Kahallatanaga (B.C. 110-103) founded kurundavasoka Vihara. There was a parivena named Kurundivelu Vihara. The village Kurundaka is mentioned in the Commentaries. Aggabodhi I (571-604) is credited with the building of Kurunda Vihara (the Sinhalese Chronicles call it Kurundu tank), around which he planted a coconut plantation said to have been 3 yojanas(25 to 30 miles) in extent. A minister of Aggabodhi IV (667-683) built a pasada in Kurundapillaka Vihaa. Vijayabahu I (1055-1110) restored Kurundiya Vihara. It is වprobable that all these are variant names of one and the same monastery situated in Kurundi-rattha, an area corresponding to present Karikattumulai South Division of Vavuniya District: the ancient name is preserved in the ruins at modern Kuruntan-Ur. The Kurundi district was under Tamil domination in the regin of Parakkamabahu II (1236-1271) and was later occupied by the invader Canadabhanu. Near Kurunda, Aggabodhi I built Ambilapassava Vihara.

83, 15-16; ලියනගමගේ, 1989:168) මේ අනුව චන්ද්‍රභානු රජු පදී හා කුරුඳු රටවල සිංහලයන් තමන්ගේ වසඟයට ගත් බව පෙනේ (අභයවර්ධන, 1978 : 96).

එච්. සී. පී, බෙල් විසින් 1905 වර්ෂයේ පුරාවිද්‍යා පාලන වාර්තාවේ තම සංචාරක සටහනේ කුරුන්දි පිළිබඳව කරුණු දක්වා තිබේ. මෙම ප්‍රදේශයේ අතීතයේ විශාල ජනාවාසයක් තිබූ බවට සාධක ඇති බව ඔහු සඳහන් කරයි. "කුරුන්ටන් ගසේ කන්ද" ලෙස ඔටියමලේ සිට සැතපුම් හතක් පමණ ඊසාන දිගින් පවතින කන්දක් හඳුන්වා ඇත. මෙහි ඇති ගස් සිංහලෙන් "පගුරුගස් ලෙස" හඳුන්වනු ලබන බව ද හෙතෙම පවසයි (Bell, 1905:19).[3]

සිංහලේ කඩයිම් පොතට අනුව "කුරුන්දක" යන නාමය හඳුන්වනු ලැබුවේ "කුරුදුගමු රට" ලෙසයි. මෙහි රට ලෙස හැඳින්වූයේ අදාළ ප්‍රදේශය හෝ දිස්ත්‍රික්කය විය යුතුය (අභයවර්ධන, 1978 : 105). අනුරාධපුරයට උතුරින් වූ කැදෑ හා කඩවත් කෝරළ දෙක කුරුඳු රට නමින් හඳුන්වනු ලබන බවට මතයක් පවතී. එසේ වුවද නිකලස් පවසන පරිදි කුරුදු රට පිහිටියේ වව්නියාවට අයත් කරිකට්ටුමලෙයි හි දකුණු කොටසෙහි ය. පැරණි කුරුන්දිරට්ඨ යන්නෙහි වර්තමාන නාමය කුරුන්තනිවූර් යන්නෙහි ගැබ්වී ඇති බව ඔහු වැඩි දුරටත් පෙන්වා දෙයි (නිකලස්, 1979 : 102).

කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය හා එහි ඇති පුරා සාධක සම්බන්ධයෙන් තොරතුරු පැරණි වාර්තා කිහිපයකම අන්තර්ගතව ඇත. ඒ අනුව පැරණිතම වාර්තාවක් වන ජේ. පී. ලුවිස්ගේ වාර්තාවේ පුරාවිද්‍යා සාධක ව්‍යාප්තිය සම්බන්ධයෙන් දීර්ඝ විස්තර කිරීම් දක්නට ඇත. එහි සඳහන් පරිදි, ගල් බැම්මේ කෙළවරේ සිට කඳු මුදුනට පියගැට පෙළක් ඔස්සේ ගමන් කළ හැකිය. කඳුමුදුන පැතලි වන අතර ඉලිප්සාකාර හෝ ඉහළ ඕවලාකාර හැඩයකින් යුක්ත වේ. පැත්තකට මුහුණලා මුලු කඳු මුදුන වටා (සමහර විට) හතරැස් කුට්ටි රැඳවුම් බිත්තියක් අඩි 7 ක් හෝ අඩි 8 ක් උසින් හා පළලින් 1/2 ත් 1 ත් අතර බැම්මක් දක්නට ලැබේ. බැම්මේ උතුරු කොටසේ පිටුපස කන්දේ නටබුන් කිහිපයක් ඇති අතර; ඒවා සියල්ලම විනාශ වී ඇත්තේ කාලයාගේ ඇවෑමෙන් නොව පසුකාලීන දෙමළ පදිංචිකරුවන් විසින් හිතාමතා කෙලෙසීමෙනි. බැම්මේ දකුණු කෙළවරේ සිට වැව් බැම්මේ දකුණු කෙළවර අතර මද දුරක් ගමන් කළ විට පෙණ පහකින් යුක්ත නාගයෙකු සහිත පුරාණ විහාරස්ථානයක් දක්නට ඇත. බැම්මට පිටුපසින් අවම වශයෙන් පන්සල් තුනක් හෝ වැදගත්කමින් යුතු ගොඩනැගිලි තුනක නටබුන් දක්නට ඇත. ඒවා මඩුකන්ද, මහකච්චිකොඩි, හෝ ඉරට්පෙරියකුලම් වැනි ස්ථානයන්හි දක්නට ලැබෙන ගොඩනැගිලි හා සමාන වේ. සමාන්තරව හතරැස් ගල් කණු පේළි තුනක් ඇත. එක් පේළියක අවම වශයෙන් ගල් කණු තුනක්වත් තිබී ඇත. එක් ස්ථානයක නිශ්චිතවම මඩුකන්දේ මෙන් මුර දේවතාවියන්ගේ කැටයම් කළ රූප සහිත මුරගල් තිබූ නමුත් ඒවා අඩකට වඩා පොළොවෙන් යටවී ඇත. පැහැදිළිවම මෙහි පියගැට පෙළක් ඇති අතර මේවා මැද ගසක් පැලවී ඇත. මඩුකන්ද විහාරයේ පියගැට පෙළේ ඇති ආකාරයට මකරා සහිත කොරවක්ගලක්, මතුපිටට ගෙන පැත්තට හරවා ඇත. මෙහි කැණීමේදී ඉහළ පඩිපෙළ දැකගත හැකි වූ අතර අනෙක කොරවක්ගල අසල යටවී තිබිය හැකිය.

[3] The neighbouring hill of Erupothana, Kuruntanmali, Kuruntan-Ur (which may have been a large settlement, and would probably repay excavation);

සියලුම කොටස් ස්ථානගතව තිබෙන්නට ඇති අතර විශාල සෙල්ලිපි ලැල්ලක් ද එහි විය. තවත් පසෙක හිස කැඩී ගිය ගව රූපයක් සහ උපාසකයෙකු නියෝජනය කරන රූපයක් ඇත. මෙම සාධක පැහැදිළිවම දෙමළ ආක්‍රමණයෙන් පසු ඉදිකරන ලද හින්දු කෝවිලට අයත් ඒවා විය.

මෙහි පෙනෙන ආකාරයට ගඩොල් ගොඩක් ලෙස දිස්වන්නේ දාගැබකි. එහි සෑම පසෙකින්ම කණුවක් දැක ගත හැකිය. සෙල්ලිපියෙහි සඳහන් "කුරුන්ගම" ලෙස හඳුන්වන ගම හෝ නගරය වැව් බැම්මෙහි පහතින් පිහිටා තිබෙන්නට ඇති බව කුඩා ජල මාර්ග හා අවට දක්නට ලැබෙන මැටි බඳුන් සාක්ෂි සපයයි. දෙමළ බසින් දැනට මෙම ප්‍රදේශයට භාවිත වන නාමය "කුරුන්දි ඌර්" වේ. පසු කාලීනව මෙහි පදිංචි වු දෙමළ ජනතාව සංඝබෝධි රජ හා අනෙකුත් රජවරුන් ඉදිකරන ලද විහාරය කඩා බිඳ දමා එහි ගඩොල් සහ ගල් කැට සියල්ල ම පාහේ ඉවත් කළහ (මෙහි තිබූ දෑ භාවිත කර 1858 දී පමණ මුල්ලිවෙයික්කාල කෝවිලෙහි ඉදිකිරීම් සඳහා භාවිත කර ඇති බව ජේ.පී. ලුවිස් මහතා තම වන්නි මැනුවල්හී දක්වා තිබේ) (Lewis J.P, 1895: 311).[4]

වැව කඩා දැමූ විට මෙහි වාසය කළ ස්වදේශිකයන් මෙම නගරය අත්හැර දැමුවේ කවදා ද යන්න නිශ්චිත ව කිව නොහැක. කිව හැක්කේ දහතුන්වන හෝ දහහතරවන සියවසේ සිට එම ස්ථානයේ ස්වදේශිකයන් වාසය නොකළ බවයි (Parker H, 1889:449 ; Lewis J.P, 1895:311-312).

ගම හා සබැඳි තන්නිමුරුප්පු වැවෙහි බිසෝකොටුවේ ගල් බොහොමයක් අවාසනාවට හින්දු දේවාලයක් ඉදිකිරීම සඳහා ඉවත් කළේ නැති නම් එය හොඳ තත්වයේ පැවති බව ලුවිස් මහතා වන්නි මැනුවල් හි වාර්තා ගත කර ඇත (Lewis J.P, 1895:295).[5]

එච්. සී. පී, බෙල් බෙල් මහතා 1905 පුරාවිද්‍යා පාලන වාර්තාවේ තම සංචාරක සටහනේ කුරුන්දි පුරාවිද්‍යා සාධක පිළිබඳව සටහන් තබා ඇත.

කුරුන්දන්-මලෙයි පිහිටා ඇත්තේ තන්නිර්-මුරිප්පු නම් වැවේ උතුරු කෙළවර සහ කුරුන්තන්-කුලම් බැම්මේ දකුණු කෙළවර අතරය. වැවේ බැම් දෙක ම කඳු අතර ඝන කැලෑවෙන් වැසී ඇත. බැම් අසල කටු සහිත වන ලැහැබ ඇති බැවින් එහි උස විනිශ්වය කිරීම අපහසුය. නමුත් එය අඩි 200 ක් පමණ වනු ඇතැයි අනුමාන කළ හැකිය. මෙය මගේ සංචාරයේදී දක්නට ලැබූනු කඳුවලින් සම්පූර්ණයෙන් ම වෙනස් ම වූ කන්දකි. මෙහි එකම පාෂාණයක්වත් නොමැති අතර කඳු මුදුන දිග පළලින් යාර 150 x 100 කින් යුතු වන අතර ඍජුකෝණාස්‍රාකාර හැඩයකින් යුක්ත වන අක්කර 3 ක් පමණ වපසරියකින් යුතු වේ. කඳු මුදුන අඩි 10 ක් පමණ ඉහළට ඔසවා වට බැම්මක් ඉදිකර ලිස්සා යාම වලක්වා ඇත. කඳු මුදුනේ පැහැදිළිව ගොඩනැගිලි හතරක් ඇති අතර තවත් ගොඩනැගිලි තුනක් සුන්බුන් ලෙස දක්නට ලැබේ.

---

[4] Stones were removed from Kuruntaniirmalai (in 1858 I believe) to build the Mullivaykkal temple. The doorway of that temple is constructed of carved stones from Kuruntaniirmalai. Diaries of June 8, August 5; 1887 and September13, 1889. 1883,

[5] At Tannirmuruippu, unfortunately, most of the stone have been removed to build a Hindu temple, otherwise it is in a good state of preservation.

ගොඩනැගිලි පිළිබඳ විස්තරයක් දීමට පෙර ඒවා ඉදි කරන ලද ද්‍රව්‍ය පිළිබඳව විස්තර කළ යුතුවේ. මක්නිසාද යත් බොහෝ ආකාරවලින් සාමාන්‍ය ඉදිකිරීම් සැලැස්ම සාම්ප්‍රදායික සිංහල ගෘහ නිර්මාණ ශිල්පයට අනුව වුව ද, භාවිත කර ඇති අමු ද්‍රව්‍යයේ විශේෂත්වයක් දක්නට ඇත.

සාමාන්‍යයෙන් කුළුණු සහ පියගැටපෙළ අනුරාධපුරයේ සහ වෙනත් තැන්වල ඉදි කර ඇති ආකාරයටම කළුගලින් නිර්මාණය කර ඇත. නමුත් මෙහි ගොඩනැගිලිවල බිත්තිවල සහ සඳළුතලවල බිත්ති, දාගැබ සහ වට ප්‍රාකාර හා මාලක විශාල ගඩොල් වැනි කුඩා කැපූ ගල්කුට්ටි වලින් ඉදිකර ඇත. අනුරාධපුර සහ පොළොන්නරු අවසන් කාලය දක්වාම ඉදිකිරීම් සඳහා ගඩොල් සහ ගල් භාවිත කර ඇත. නමුත් මෙහි ගල ඝන වූ දුඹුරු පැහැති ස්පොන්ජියක් මෙන් දැඩි, යට සිදුරු සහිත එකකි (Bell, 1905:33)[6].

පාකර් මහතා, මෙම කඳුශිඛරය මත ඉදිකිරීම් හඳුන්වන්නේ "altered gneiss" (නයිස් පාෂාණය වෙනුවට ආදේශකයක් ලෙස) යනුවෙනි. එය අඟල් 10 ත් අඟල් 12 ත් අඟල් 41/2 කින් පමණ කුට්ටිවලට කපා ඇත, නමුත් ඒවා සෑම විට ම නිශ්චිතව, එකම ප්‍රමාණයෙන් යුතු ගල්කුට්ටි නොවේ, මේවා සාමාන්‍ය බන්ධනයකින් තොරව වියළා ඇත. බිත්ති කිසිවක බදාම ආලේප කර ඇති බවක් පෙනෙන්නට නැත.

කඳු මුදුනත පහත සඳහන් පරිදි ගොඩනැගිලි එක් එක් කෙළවරේ ආසන්න වශයෙන් එක බැගින් ඉදිකර ඇත. ඊසාන දෙසින් දාගැබ, වයඹ දෙසින් විහාරය, ගිනිකොණ දෙසින් වට-දා-ගේ සහ නිරිත දෙසින් මනා නිමාවකින් යුත් විශාල ගොඩනැගිල්ලකි. මෙය සමහරවිට පිළිම-ගේ විය හැකිය.

දාගැබ මට්ටම් හතරකින් ඉදිකරන ලද උස් පාදමක ඉතා කුඩා එකක් වූ අතර එහි ඉහළ කොටස් දෙක වෘත්තාකාර විය. ගල් කුට්ටිවල ස්ථායීතාවය නොමැතිකම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිල්ල දිරාපත්වීම නිසා එය අනුරාධපුරයේ මිරිසවැටිය දාගැබේ මෙන් ඉහළ මට්ටමක නොමැත. එක් කුළුණක් දාගැබේ බටහිර පැත්තට ඉදිරියෙන් පිහිටා ඇති අතර, එය පූජාසනයක හෝ පූජා පැවැත්වීමට සකස් කරන ලද මණ්ඩපයක් විය හැක. එය බොහෝ දුරට විනාශයට පත් ව ඇතත් දාගැබ එහි හැඩය ප්‍රමාණවත් ලෙස රඳවාගෙන ඇති අතර ඉහතින් මා විස්තර කර ඇති ගල් කුට්ටි උපයෝගී කරගෙන ඉදිකර ඇති බව පෙන්නුම් කරයි.

විහාර ගෙය අඩි 50 ක් උස කුළුණු තිස් හයකින් යුත් ගොඩනැගිල්ලකි. නැගෙනහිරට මුහුණ ලා ඇති කොටස අඩි 40 කින් යුතු වේ. බිත්ති සහ දොරටුව පසින් වැසී ඇත. හොඳින් සකස් කරන ලද හතරැස් කුළුණු වන අතර ඒවා අඩි 1 පොළොව යටට ගිල්වා ඇත. එය පොළව උඩින් අඩි 10 ක් පමණ වේ.

වටදාගෙයි විෂ්කම්භය අඩි 35 ක වෘත්තාකාර ගොඩනැගිල්ලකි. පිටත බිත්තිය අඩි 2 1/2 ක් පමණ ඝන ගල් කුට්ටි වලින් ඉදිකර ඇති අතර, එයට කුළුණු දොළහක් ඇතුළත් කර ඇත. ඒවා සියල්ලම කැඩී ඇත. ඇතුළත කණු අටකින් වට වූ තවත් කවාකාර කාමරයකි. ඉන් තුනක් නොකැඩී සුන්බුන්වලට අඩි 5 ක් පමණ ඉහළින්

[6] small cut blocks of stone like large bricks.... The stone is a hard, brown, porous one, rather like solidified sponge.

පවතී. සියළුම කුළුණු හතරැස්ය. පිවිසුම උතුරින් වන අතර අඩි 3යි අඟල් 8 කින් යුත් සරල ගල් පඩි හතරකින් සමන්විත වේ. මෙහි මුරගල් හා කොරවක්ගල් ඉවත් කර හෝ විනාශ කර ඇත.

ගොඩනැගිලි තුනෙන් පිළිම-ගෙය, කුළුණු වඩාත් විස්තීර්ණ හොඳම තත්වයේ පවතින ගොඩනැගිල්ලයි. එය වේදිකාවක් මත ඉදි කර ඇත. වේදිකාව අඩි 85 ක් හා අඩි 64 කින් ද, සහ අඩි 4 ක් හෝ 5 ක් පමණ උසට ගල් කුට්ටි වලින් ඉදිකරන ලද රැඳවුම් පවුරකින් රඳවා ඇත. මෙයට ඇතුල් වන ස්ථානය නැගෙනහිර පසට පිහිටා ඇති අතර කැටයම් නොකරන ලද පඩි පෙළකින් ද කොරවක්ගල්වලින් ද සමන්විතය. මෙහි මුරගල් අතුරුදහන්ව ඇත. ඇතුල් ගෘහය අඩි 36 x 30 ක් පමණ වන අතර අමතර ආලින්දය වර්ග අඩි 15 කි. ඇතුල් ගෘහය හතරැස් කුළුණු 36 කින් යුක්ත වේ. අඩි 8 ක් පමණ උස මෙය අඩි 1 x 1 ක් දිග පළලින් යුක්තය. ආලින්දයේ කුළුණු දහයක් ඇති අතර, ඒවායින් හතරක් හැර අනෙක්වා කැඩී ඇත, මා කලින් දැක ඇති අග නගරයේ ගොඩනැගිලි රටාවට වඩා වෙනස් රටාවකට මෙය ඉදි කර ඇත. ප්‍රවේශය වැළලී ඇති නමුත්, මුරගල "මල් පෝච්චි" මෝස්තර ඇති බව දැකගත හැකිය. ආලින්දය සහ ගොඩනැගිල්ලේ ප්‍රධාන කොටස අතර දොරකඩ අඩි 6 ක් පමණ දිග සියුම් ගල් ලෑල්ලක් තිබූ අතර ඉන් වැඩි කොටස ඒ අසල බිම වැටී ඇත. කැටයම් කරන ලද ඝණ සහ මකර ද්විත්ව පේළියකින් එය එහි මුළු දිග දිගටම අලංකාර කර ඇතඃ සාමාන්‍යයෙන් සිංහල කැටයම්වල දක්නට නොලැබෙන ආකාරයේ ගණ රූප මෙහි දක්නට ලැබේ. ඔවුන්ගේ හිසෙහි උස තොප්පි පැළඳ ඇති ලෙස පෙනේ. එක පේළියක දොලොස් දෙනෙකු සහ අනෙක් පේළියේ අට දෙනෙකු ඇත. ගොඩනැගිල්ලේ බිත්ති ගල් කුට්ටි වලින් ඉදිකර ඇත.

ඉහත සඳහන් කළ ගොඩනැගිලි හතරට අමතරව, ගල් කුට්ටි සහිත ගොඩැලි දෙකක් පිහිටා ඇති අතර ඒවායේ පිහිටීම අනුව පිළිවෙලින් විහාරයේ සහ වට-දා-ගේ සඳහා ඇතුල්වීමේ දොරටු විය හැකිය. දකුණු ප්‍රාකාරයට ආසන්නව, වට-දා-ගේ සහ පිළිම-ගෙට සමාන දුරින් කුළුණු කිහිපයක් සහ තවත් කුඩා ගොඩනැගිල්ලක් ඇත. කඳු මුදුනේ වෙන කිසිවක් නැත. උතුරේ සහ නැගෙනහිර දෙපස කොටස අඩි 60ක් පළලින් යුක්ත වූ නමුත් ඉතිරි පැති දෙක සම්බන්ධයෙන් මට වඩාත් සැක සහිතය, නමුත් යටි පඳුරු ඉවත් කිරීමෙන් ප්‍රශ්නය එකවර විසඳෙනු ඇත. මා විසින් සැලැස්මේ මේ මාලකයේ පවුර තිත් ඉරි වලින් ඇඳ ඇත.

මාලකය මත කුඤ්ඤ ගල් කණු දොළහ බැගින් දහසයක් ඇත. මේවා පන්සල් සහ ආරාමයේ ජීවමාන කොටස බවට සැකයක් නැත (භික්ෂු කුටි). කඳුකරයේ දකුණු හා බටහිර පැතිවල පහළ මාලකයක් තිබූ බව සිතමි. බටහිර දෙසින් කඳු මුදුනේ අඩි 200 ක් දුරින් තාප්පයක් මට හමු වූ අතර දකුණින්, ඒ හා සමාන දුරකින් තවත් බිත්තිවල සලකුණු වලට අමතර ව, අඩි 80 දිගින් හා අඩි 60 ක් පමණ පළල ගැඹුරු පොකුණක් මට හමු විය. මෙම පොකුණ දැන් කුහරයක් පමණි, නමුත් සමහර විට කැණීම සිදු කළහොත් එහි ගල් බැම්ම දැක ගත හැකිවිය හැක.

කඳු මුදුනේ වන සියලුම කරුණු විස්තර කළෙමි. ඉතිරිව ඇත්තේ ආරාමය පහත පැරණි නගරය හා සම්බන්ධ කරන පුළුල් පියගැට දෙකක් පමණි. නැගෙනහිර පියගැට පෙළ වඩාත් හොඳ තත්වයේ පවතී.

කඳු මුදුනේ සිට පහළ මාලය දක්වා පියගැට දහඅටක පියගැටපෙළක් ඇත, ඒ සෑම එකක්ම අඩි 17 ක් පමණ දිග, පළල අගල් 10.5 පළල හා අගල් 6 ක් උස නයිස් පාෂාණයෙන් සාදන ලද පඩි ගල්වලින් යුතු වේ. මෙම පඩි පේළිය පැති රැඳවුම් බිත්තිය හරහා ගිල්වා නැත. අඩි 10 ක් පමණ බැස මාලකය මැදට බැස යයි. ඉන්පසු මාලකය අද්දර සිට අඩි 17 දිගින් හා පළල අඩි 1 කින් ද අගල් 4 1/2 ඝණකමකින් හා අගල් 6 1/2 කින් ඝනකම වන පියගැට 100 කින් යුතු විශාල පඩි පෙළකින් පහළ වනාන්තරයට දෙසට බැස යයි. මෙම පඩිපෙළ කඳු පාමුලට නොපැමිණෙන නමුත්, සමහර විට ඊට පහළින් ගමන් කළ පඩි පෙළකට සම්බන්ධ විය හැක. අර්ධයක් වැළලී ගිය තැන් හැර දැන් කිසිදු හෝඩුවාවක් නොමැත.

උතුරු පඩිපෙළ බොහෝ සෙයින් විනාශයට පත්ව ඇති නමුත් බටහිර පස දක්නට නොමැති දෙයක් මෙහි දක්නට ලැබේ. වැළලී ඇති සරල මුරගල් යුගලයක් දක්නට ඇත. ඒවා අගල් 6 ක පමණ ප්‍රමාණයක් නිරාවරණයව පවතී (Bell, 1905:32-34).

බෙල් මහතාගේ පාලන වාර්තාවේ කඳු පාමුල වන පුරාවිද්‍යාත්මක සාධක කුරුන්දන්-ඌර් ලෙස වෙනමම විස්තර වාර්තාකොට ඇත.

ඔහුගේ මතය වන්නේ වන්නි මැනුවල් හි ලුවිස් දක්වන අදහස් හා සම්පූර්ණයෙන් එකඟ නොවන බවත් මෙහි කඳුමුදුනේ ඇති ගොඩනැගිලි සියල්ලම පැහැදිළිවම බෞද්ධ ආරාමික ගොඩනැගිලි වන අතර ඒවා හොඳින් සංරක්ෂණය කළ හැකි තරමින් ඉතුරුව පවතින බවත්ය. පහළ නගරයේ වන හින්දු ඉදිකිරීම් පොළොන්නරුවේ තරම් නොවුනත් ඒවා බෞද්ධ ජනතාව නව හඳුන්වාදීම් සමග දක්වන සහයෝගීතාව පෙන්නුම් කිරීමක් බව ද බෙල් ප්‍රකාශ කරයි (Bell, 1905:34-35).

1933 පුරාවිද්‍යා පාලන වාර්තාවේ කුරුන්දන්මලෛ හෙවත් කුරුන්දාන් විහාරය පිහිටි භූමිය පුරාවිද්‍යා තහනම් භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ බව සඳහන් කර ඇත. එහි දී මෙම භූමිය ඉතා වැදගත් පුරාවිද්‍යාත්මක සාධක සහිත භූමියක් වූ බැවින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ බව ද එහි සඳහන් කොට ඇත (ASCAR 1933:5). මේ අනුව 1933 මැයි මස 12 වන දින ගැසට් අංක 7981 මගින් හෙක්ටයාර 78 රූඩ් 1 පර්චස් 62 භූමියක් ගැසට් මගින් පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 1949 වර්ෂයේ පුරාවිද්‍යා පාලන වාර්තාවේ දී සෙනරත් පරණවිතාන මහතා මෙහි ඉංග්‍රීසි පාලන සමයේදී විවිධ වාර්තාවල සඳහන්ව තිබූ සෙල්ලිපිය කැබලි ගණනාවකින් යුක්තව හමු වූ බව වාර්තා ගත කොට තිබේ (ASCAR 1949:33). මේ පිළිබඳ වැඩි දුර විස්තරය කුරුන්දි සෙල්ලිපි පිළිබඳව විස්තරයේදී දක්වා ඇත).

2004 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පළ කරන ලද Inscriptions of Ceylon Vol. V, Part II හි කැබලිවලට කඩන ලදුව, සොයාගනු ලැබූ සෙල්ලිපිය ස්පර්ශ ලාංඡන මගින් කියවා පල කර ඇත (මේ පිළිබඳ වැඩි දුර විස්තරය කුරුන්දි සෙල්ලිපි පිළිබඳ විස්තරයේ දී දක්වා ඇත).

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද, සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති පැරණි ස්මාරක නාමාවලියේ කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය පිළිබඳව 159/1 යටතේ වාර්තාගත කර ඇත.

159/1 කුරුන්දන් මලේ -

දිස්ත්‍රික්කය - වවුනියාව

ප්‍රා.ආ.නි.කො. - මුහුදුබඩ පත්තුව

ගම - කුමන මුනෙයි

සිතියම - බී.21/58

කුරුන්දන් කුලම් නමැති වැව පාමුල පැරණි බලකොටුවක අවශේෂයන් ඇත. මෙම බල කොටුවේ තුන් පැත්තක පසින් සෑදූ කණ්ඩියක් ඇත. මෙම බල කොටුවේ තුන් පැත්තක් පසින් සෑදූ කන්ඩියක් මත ගලෙන් තනා තිබෙන ප්‍රාකාර බැම්මකින් වටවී තිබේ. අනික් පැත්ත වැව් කන්ඩියෙන් ආරක්ෂා වී ඇත. මෙම කොටුව තුළ ජරාවාස වූ කුඩා දාගැබක අවශේෂ වී ඇත. එහි මුරගල් යෙදූ ගල්කුළුණු සහිත ගොඩනැගිලි කිහිපයක අවශේෂයන් ද ඇත. මෙහි සිව දේවාලයක අවශේෂයන් ද තිබේ. සෑම තැනම වාගේ ගල්කුළුණු කැලි දකින්නට ඇත.

මාර්ගය- මුලතිව් අලම්පිල් පාරේ 6 වෙනි හා 7 වෙනි සැතපුම් අතරින් බටහිරට හැරී නෙඩුන්කේනි පාරේ සැතපුම් 7 ක් පමණ යෑමට ඇත.

මෙහිදී කන්ද මුදුනේ පවතින පුරාවිද්‍යා සාධක වාර්තාගත කොට නැත (පැරණි ස්මාරක නාමාවලිය 1972:219). නමුත් කන්ද පාමුල පැවති පුරා සාධක මනාව විස්තර කර ඇත.

සිරිල් මැතිව් මහතා විසින් ජාතිවාදී අහිතකර පූර්වමතියෙන්, නීති විරෝධී අත්පත් කර ගැනීමෙන් හෝ හිතාමතාම කරන විනාශ කිරීමෙන් උපද්‍රවයට ලක් වී ඇති, ශ්‍රී ලංකාවේ සංස්කෘතික වස්තු සම්පත හානියෙන් බේරා සංරක්ෂණය කර තබා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් යුනෙස්කෝ ජගත් සංවිධානය වෙත ඉදිරිපත් කරන අභියාචනාවේ, "1981 අගෝස්තුවේදී ජාතිවාදී කලබල පැවති සමයේ හදිසි තත්වයක් ප්‍රකාශයට පත්කොට තිබියදී ඇතැම් පුද්ගලයන් පුරාවිද්‍යා ආරක්ෂිත ප්‍රදේශයට අවසර නැතුව ඇතුළුවී, පසු ව නවීන හින්දු කෝවිලක් බවට පරිවර්තනය කරවීමේ අදහසින්, පැරණි බුදු ගෙයක ඉතිරි වී ගිය ගල් කණු මත උළුහොයන කරන ලද වහලක් තනා තිබුණි. බුදු ගෙය ඇතුළත බිමෙහි කොන්ක්‍රීට් සහිත සිමෙන්ති දමා ත්‍රිශූලයක් ද සවි කොට තිබුණි. කපුරු ආදිය පත්තු කිරීම සඳහා, ත්‍රිශූලය ඉදිරිපස තබා තිබුණු ගල් පුවරුව බුදුන්ගේ ශ්‍රී පාද ලාංඡනය සහිත ගලකි. ත්‍රිශූලයක් සවි කිරීම සඳහා අසල තිබුණු ස්තූප ගොඩනැගිල්ලේ මුදුන මට්ටම් කොට සිමෙන්ති දමා තිබේ. ඉතා පැරණි බෞද්ධ විහාරයක් තිබුණු ස්ථානයක හින්දු කෝවිලක් තැනීම සඳහා ප්‍රයත්නයක් දරා ඇති බව පෙනේ (පුරාවිද්‍යා ලිපිගොණු අංක ඊ.සී/බී/ඇන්/7 පත්‍රිරු 5 සහ 10. D පරිශිෂ්ටය 44 - 47 පිටු බලන්න)." ලෙස දක්වා ඇත. (සිරිල් මැතිව් 1983:17-18).

දශක ගණනාවක් පුරාවට පැවති යුධමය වාතාවරණය යටතේ මෙම ප්‍රදේශය පිළිබඳව පුරාවිද්‍යා කටයුතු සිදු කිරීමට නොහැකි විය. නමුත් විවිධ ස්වාධීන පර්යේෂකයන්ගේ ලිපි මෙම ස්ථානය පිළිබඳව ලියැවී ඇත. ඉන් පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් ප්‍රමුඛ ස්ථානයේ ලා සැලකිය හැකිය.

උන්වහන්සේ විසින් ඉතා දුෂ්කර වන ලැහැබ පීරා මෙම ස්ථානයට ලගා වූ බව දක්වා ඇත. "කන්දේ සෑම තැනකම විවිධ වර්ගයේ නටබුන් මහත් රාශියක් තිබේ. මෙහි වට අඩි 140 ක් වූ උස අඩි 21 වූ ද ගඩොළු ගොඩනැගිල්ලකි. එය හරි මැදින් හාරා ගඩොළු විසුරුවා විනාශ කර තිබේ. නිසැක ලෙසම මෙය මෙහි තිබූ දර්ශනීය දාගැබ බව පැහැදිලිය. මෙම ගඩොළු ද ඉතා පැරණි යුගයට අයත් ඒවාය. මඳ මඳ මතුවී ඇති අත්තිවාරම් සහිත ගල් කණු ඇති තවත් ගොඩනැගිල්ලකි. මෙයට පිවිසීමට තිබූ දොරටුව ළඟ වළක් සාරා තිබිණි. ගොඩනැගිල්ල සහමුලින්ම විනාශ වී තිබේ. මේ අතර වටදාගෙයක සලකුණු ද දක්නට ලැබේ. මෙහි සමහර නටබුන් හිතාමතාම විනාශ කර ඇති බව දක්නට ලැබිණි. ස්ථානයට ජලය ලබා ගැනීම පිණිස පාවිච්චි කරන ලදැයි සැලකිය හැකි ළිං හෝ පොකුණු හෝ දෙකක ශේෂ ද පියගැට පෙළ ශේෂ ද දක්නට ලැබේ. මේ සියල්ල විමසීමේ දී ඉතා හොඳින් පැහැදිලිවන කරුණක් නම් මේ පූජනීය ස්ථානය රා.ව.පු. යුගයේ ආරම්භව වරින් වර වර්ධනය වී ඉතාමත් දියුණුවට ගිය වැදගත් බෞද්ධ ආරාමයක් මෙහි වූ බවයි" (මේධානන්ද එල්ලාවල, 2003:377).



ස්තූපය කැණීමට පෙර

## 3. පරිච්ඡේදය

# වර්තමාන පුරාවිද්‍යාත්මක මැදිහත්වීම් කටයුතු

දශක ගණනාවක වූ යුධමය වාතාවරණය පහවී යාමත් සමගම 2010 වසරේ උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනාගැනීම හා සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණයේ දී මෙම ස්ථානයට බොහෝ කලකට පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් වාර්තා ගත කරනු ලැබීය. මෙම මූලික ගවේෂණයේදී පැවති අනාරක්ෂිත භාවය හේතුවෙන් කන්ද ආශ්‍රිත පුරාවිද්‍යා ස්ථානය පමණක් වාර්තා ගත කර ඇත. දාගැබ හා පිළිමගෙයත් කඳු මුදුනේ පවතින නටබුන් ස්ථාන පිළිබඳවත් සඳහන් කර ඇති අතර එම අවස්ථාව වන විට ස්තූප ගොඩැල්ල මධ්‍යය නිදන් සොරුන් විසින් හාරා තිබී ඇත (උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම හා සිතියම් ගත කිරීමේ මූලික ගවේෂණ වාර්තාව - 2010). මෙම අවස්ථාවේදී මෙම ස්ථානය කුරුඳුමලය පුරාවිද්‍යා තහනම් ඉඩම බව හඳුනාගනු නොලැබිණ. තන්නිමුරිප්පුකුලම් නටබුන් ලෙස වාර්තාගත කර ඇත. පසු ව සිදුකළ පර්යේෂණ හා සොයා බැලීම් මගින් මෙම ස්ථානය 1933 දී පුරාවිද්‍යා තහනම් ඉඩමක්



පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් ගවේෂණ කටයුතු සිදුකරමින්

වව්නියාව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන් විසින් විවිධ බාධක මධ්‍යයේ 1933 දී පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත් කළ භූමිය 2021 දී ගවේෂණය කොට හඳුනාගත් අතර එම භූමිය නැවත මිණුම් කටයුතු සිදු කර පැහැදිලිව මායිම් යොදන ලදී. එහිදී සිදු කළ ගවේෂණයේ දී 1933 දී හඳුනාගත් පුරාවිද්‍යා භූමියෙන් ඔබ්බෙහි පුරාවස්තු පැතිර පවතින බැවින් තහනම් ඉඩම පුළුල් කළ යුතු බව යෝජනා විය. ඒ අනුව නොයෙක් බාධක හමුවේ පුරාවස්තු සහිත භූමිය ආරක්ෂා කර ගැනීම සඳහා මේ වන විටත් කටයුතු සිදු කරමින් පවතී.

ඉන් අනතුරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගවේෂණ පිළිබඳ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් මහජන අවධානය යොමු විය. ස්වාධීන ගවේෂකයන් විසින් අන්තර්ජාලයට එක් කළ තොරතුරු මගින් ද ජනතාව තුළ මෙම ස්ථානය නැරඹීමටත් ඉන් ඔබ්බට ගොස් ගවේෂණය, සංරක්ෂණය, පිළිසකර කිරීම ආදි කටයුතු කෙරෙහි උනන්දුවක් ඇති කරනු ලැබීය. එහෙත් මෙම පුරාවිද්‍යාත්මක උරුමය වැනසීමට නිදන් කොල්ලකරුවන්ගේ මෙන් ම ආගම්වාදී, ජාතිවාදී සහ අන්තවාදීන්ගේ ද බලපෑමට ලක්වීම ද ඇරඹිණි. පුරාවිද්‍යා ස්ථාන වාණිජකරණයට ලක්කර මුදල් ඉපැයීමට ලොල් වූ පිරිසක් ද ඒ අතර වූ බව කණගාටුවෙන් වුවත් සඳහන් කළ යුතුය. පුරාවිද්‍යා බිම්, ස්මාරක විනාශ කරන මෙන් ම විකෘති කරන අන්තවාදී බලපෑම් නිරන්තරයෙන් වාර්තා විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ගල්ගමුවේ ශාන්තබෝධි හිමියන් එක්ව මෙම පුරාවිද්‍යා භූමිය සංවර්ධනය කිරීමට ඉදිරිපත් විය. මෙයට එරෙහි වූ දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රීන් සහ ඔවුන්ට හිතවත් අන්තවාදී පිරිසක් මෙම ප්‍රයත්නය දෙමළ ජාතිකයන්ගේ ඉඩම් ඇල්ලීමට කටයුතු කිරීමක් බව හුවා දක්වා කලහකාරී ව හැසිර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හා ගල්ගමුවේ සන්තබෝධි හිමියන්ට එරෙහි ව 2018.09.05 වැනි දින, ඔඩ්ඩුසුඩාන් පොලීසිය විසින් මුලතිව් මහෙස්ත්‍රාත් අධිකරණයේ ඒ. ආර්. 643/18නඩුවක් ගොනු කරණු ලැබීය. එහිදී බුදු පිළිමයක් තැන්පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්ශවයක අතර වූ ගැටුමක් බවට සාවද්‍ය ලෙස චෝදනා ඉදිරිපත් කර ඇත. උතුරු පළාතේ සියලු අධිකරණ භාෂාව දෙමළ වූ බැවින් මේ සම්බන්ධයෙන් අධිකරණ කටයුතුවල දී නිතිඥ සහාය ලබා ගැනීම දුෂ්කර කටයුත්තක්ව පැවතිනි.

පූජ්‍ය ගල්ගමුවේ සන්තබෝධි හිමියන් විසින් එවකට සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සභාපති ජගත් සුමතිපාල මහතා ඇතුළු සම්මේලනයේ නිලධාරීන් කිහිප දෙනකු සමඟ සාකච්ඡාවක් පැවැත් වූ අතර, එදින ම පැවති බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලයේ සාමාජික මහා සංසරත්නය සහ එහි සාමාජිකත්වය දරණ ප්‍රධාන පෙළේ බෞද්ධ සංවිධාන නියෝජිතයන් සමග ද මේ පිළිබඳ දීර්ඝව සාකච්ඡා කරනු ලැබීය. පූජ්‍ය ගල්ගමුවේ සන්තබෝධි හිමියන් විසින් රචිත අනාගත බෞද්ධ පුනරුදයක හැරවුම් ලක්ෂය, මුලතිව්, කුරුන්දි විහාරය යළි ගොඩ නැඟීමේ මෙහෙයුම, නම් ලිපියේ මෙසේ සඳහන් වේ.

''එහි දී (සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ) මුණගැසුණු එවකට සභාපති ජගත් සුමතිපාල මහතා කුරුන්දි විහාරය ගොඩනැගීමේ යෝධ ශක්තිය වූ අතර බෞද්ධ සම්මේලනයේ නීතිඥ මහතුන් එම නඩුවට ඉදිරිපත් වීමට ද පොරොන්දු විය. එය මා හට මහත් අස්වැසිල්ලකි". කුරුන්දිය සම්බන්ධයෙන් වූ නඩුව 2020.08.17 වැනි දින මූලස්ථාන පොලිස් පරික්ෂකවරයාගේ ඉල්ලීම පරිදි අවසන් විය.

එයට අමතරව බෞද්ධ මහා සම්මේලන සභාපතිවරයා විසින් ස්ථාපිත කර තිබූ "බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව" වෙත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයා හා නිලධාරීන් උතුරු නැගෙනහිර පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව සාක්ෂි ලබා දුන් අතර එහි දී ඒ ප්‍රදේශයන්හි පැවති පුරාවිද්‍යා ස්ථානයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලදී. මෙම කරුණු ඉදිරිපත් කිරීම කුරුන්දි විහාරයේ අනාගතය වෙනුවෙන් ඉතා වැදගත් සන්ධිස්ථානයක් විය.

ජගත් සුමතිපාල මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කුරුන්දි විහාරය සිය පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ගොඩනැංවීම සඳහා පූර්ණ දායකත්වය ලබා දීමට ඉදිරිපත් විය.





ස්තූපයේ කැණීම් කටයුතු ඇරඹීම

ඒ අනුව කුරුන්දි විහාරයේ දාගැබ කැණීම් කිරීම 2021 ජනවාරි 18 වන දින, ජාතික උරුම, ප්‍රාසාංගික කලා සහ ග්‍රාමීය කලා ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාත්, බුද්ධශාසන ආගමික කටයුතු සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ මහාචාර්ය කපිල ගුණවර්ධන මහතාත්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වූ මහාචාර්ය අනුර මනතුංග මහතාත්, මෙම කාර්ය සඳහා දායකත්වය දක්වන ජගත් සුමතිපාල මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී.

මෙහි කටයුතුවල නිරතවන නිලධාරීන් හට සිංහල වීර විදහන සංවිධානයේ ආරම්භක සමාජිකයෙකු වූ බී.ඒ. මහිපාල මහතාගේ දායකත්වයෙන් සහ යුධ හමුදා දායකත්වයෙන් අර්ධ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කර දෙන ලදී.





ස්තූපයේ කැණීම් කටයුතු අතරතුර





ස්තූපයේ කැණීම් කටයුතු අතරතුර

පුරාවිද්‍යා නිලධාරීන්, යුධ හමුදා සෙබළුන් සහ සිවිල් ආරක්ෂක සෙබළුන්ගේ කැපවීම මත මාස තුනක් වැනි කෙටි කාලයකින් දාගැබෙහි කැණීම් කටයුතු අවසන් විය.

මෙම කුරුන්දි විහාර භූමිය සංරක්ෂණයට පෙර සිට ම දෙමළ ජාතිකයන් පිරිසක් එය හින්දු පුදබිමක් බවට දැඩි මතවාදයක් ගෙන ගිය අතර කැණීම් ආරම්භ කළ මොහොතේ සිට යූප ස්ථම්භය ශිව ලිංගයක් බවට සමාජ මාධ්‍යයන් හරහා ප්‍රචාරයන් සිදු කළ ද පුරාවිද්‍යාඥයින් විසින් පැහැදිලි ව ම එය යූපගලක් බවට සාධක ගෙනහැර දක්වනු ලැබීය.



ස්තූපයේ කැණීමෙන් අනාවරණය වූ යූප ගල

ඉතා පැහැදිලි ව බෞද්ධ පුදබිමක් බව මෙහි ඇති පුරාවිද්‍යාත්මක සාධක නිරීක්ෂණය කරනු ලබන කාහටත් නිසැකයෙන්ම පසක් වන සාධක මෙහි දක්නට ලැබේ.

කැණීම් කටයුතු අවසන් කර 2020.05.12 දින ජගත් සුමතිපාල මහතා පළමු ගඩොල දාගැබ මත තබා නිල වශයෙන් සංරක්ෂණ කටයුතු ආරම්භ කළේය.

පිළිසකර කරන ලද දාගැබේ වැදගත්ම කර්තව්‍යය වුයේ සාම්ප්‍රදායානුකුලව ගර්භ ගෘහයේ ධාතු තැන්පත් කිරීමයි. 2021 ජුනි 12 වැනි දින වන විට ඒ සඳහා සියලු කටයුතු සංවිධානය කරණු ලැබීය. මෙම කටයුත්ත අතිපූජ්‍ය මහානායක, සහ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ද සහභාගීත්වයෙන් සිදු කිරීමට නියමිතව සියල්ල සුදානම් කර තිබිණ. ධාතු ගර්භයේ තැන්පත් කිරීම සඳහා සර්වඥ ධාතුන් වහන්සේලා, රිදීයෙන් කළ ත්‍රිපිටක ග්‍රන්ථ ඇතුළු විවිධ මංගල සංකේත සහ වෙනත් පූජා භාණ්ඩ ආදිය ද පෙරහැරෙන් දාගැබ වෙත වැඩම වීමට කටයුතු සම්පාදනය කර තිබිණ.



ස්තුපයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින්

යුධ හමුදාව, විශේෂ කාර්ය බලකාය හා පොලිසිය අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට කටයුතු සලසාලීය. කොළඹ සහ වෙනත් ප්‍රදේශවල සිට සැදැහැවතුන් රැසක් මෙම දුර්ලභ අවස්ථාව දැක බලා, වන්දනා කිරීමට පැමිණෙමින් සිටියේය. එහෙත් උදෑසන 9.30 ට පමණ දෙමළ දේශපාලනඥයන් පිරිසක් මහා සංඝරත්නයට මග අවුරමින් පූජා භූමියට ඇතුළ් වීම වළකමින් කලහකාරී ලෙස හැසිරුණි. මෙම පිරිස අතර සිටියවුන් පිරිසක් විසින් මහා සංඝයා වහන්සේ කිහිප නමක් වටකර විවිධ හිංසා පීඩා කර තිබිණ. මේ වන විට සිද්ධිය සම්බන්ධයෙන්යම් කිසි බලපෑමක් මත ආරක්ෂක අංශ මැදිහත් වීම අපගමනයකට ලක්වීය.
තත්ත්වය සමනය කිරීම සඳහා කුරුන්දි පුදබිමේ උත්සවයට සහභාගි වීමට පැමිණි සැදැහවතුන්ගේ වාහන නවතාලීම හෝ අතරමගින් හරවා යැවීමට ආරක්ෂක අංශ කටයුතු කළ ද කලහකාරීන්ට එම ස්ථානයට පැමිණීමට බාධාවක් නොවීය. අවසානයේ ආරක්ෂක අංශයන්ගේ ඉල්ලීම වුයේ මෙම පුණ්‍ය උත්සවය කල් දමන ලෙසය. එයට හේතුව ලෙස දක්වා සිටියේ මුලතිව් හි කෝවිලක විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් උත්සවයක් පැවැත්වෙන බැවින් මෙම උත්සවය කල් දැමිය යුතු බවයි. දෙමළ දේශපාලනඥයන් සමග සාකච්ඡා කළ පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පැවති අර්බුදකාරී තත්වය සමනයට පත් කිරීම සිදු කළ යුතු බැවින් එම අවස්ථාවේ ධාතු නිධානෝත්සවය නතර කරන ලදි.

මෙම සිද්ධියෙන් පසු 2022 ජුලි 14 වැනි දින මුලතිව් අධිකරණය ඒකපාර්ශ්වීයව තම අධිකරණ බලයට අදාළ නොවන තීන්දුවක් මගින් පොලීසියට නියෝග කර තිබුණේ

සංරක්ෂණය කළ චෛත්‍යය ගලවා ඉවත් කළ යුතු බවය. එහෙත් පොලීසිය විසින් එම ජනතාව කුපිත කරන නියෝගය ඉටු කළ නොහැකි බව නීතිපතිවරයාට දන්වා තිබිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහේස්ත්‍රාත්වරයා කුරුන්දි පුදබිමේ නිරීක්ෂණ චාරිකාවකින් පසු තමන් විසින් ලබාදුන් තීන්දුව තමන් විසින්ම අත්හිටුවීය. කෙසේ වෙතත් මේ වන විට රටම කතා කළ මාතෘකාව වූයේ කුරුන්දි පුද බිමට බලපා ඇති ව්‍යාකූල තත්ත්වයයි. ඇතැමුන් මෙම සිද්ධිය හා කිසිදු සම්බන්ධයක් නොමැතිව හුදු තම ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට මෙම සිදුවීම භාවිත කරමින් දාගැබ වෙනුවෙන් සහ නෛතික කටයුතු සඳහා යැයි ද පවසමින් ආධාර එකතු කළ බව වාර්තා විය. නෛතික කටයුතුවලට හා සංරක්ෂණ කටයුතු සඳහා පූර්ණ දායකත්වය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ලැබුවේ බෞද්ධාලෝක පදනම විසිනි. අධිකරණ ගැටලුවල දී ජනාධිපති නීතිඥවරුන් වන මනෝහර ද සිල්වා, ප්‍රසන්තලාල් ද අල්විස් සහ උදිත ඉගලහේවා යන මහත්වරු අවශ්‍ය මැදිහත්වීම් කළ අතර චතුර දෙමළ භාෂා දැනුම ඇති නීතිඥ සමිත කල්හාර මහතා ද ඇතුළු සියලු නීතිඥවරු බෞද්ධාලෝක පදනම වෙනුවෙන් නිස්සරණ අධ්‍යාසයෙන් සහයෝගය දැක්වූහ. මෙම අර්බුදකාරී අවස්ථාවේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර සහ වෛද්‍ය මහාචාර්ය චන්න ජයසුමන යන මහත්වරු පාර්ලිමේන්තුවේ දී මෙම සිද්ධිය පිළිබඳ කරුණු දැක්වූ අතර සැබෑ තතු ලොවට කියා පෑමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහයෝගය දැක්වූහ.

කුරුන්දි පුද බිම මේ වන විට කැණීම් මගින් ඓතිහාසික බෞද්ධ පුදබිමක් බව තහවුරු ව තිබිය දීත් 2022 ජූලි 22 වැනි දින හිටපු දෙමළ සන්ධාන මන්ත්‍රීවරයෙකු වූ හරිහරන් මහතා විසින් එහි හින්දු කෝවිලක් සේ සලකා පූජා පැවැත්වීමට අසාර්ථක උත්සාහයක් ගනු ලැබ තිබිණ. චාරිත්‍රානුකූලව ඉදිරි සංරක්ෂණ කටයුතු සඳහා ගර්භ ගෘහයේ ධාතු නිධානෝත්සවය පවත්වා එය වසා දැමිය යුතු බැවින් ඒ සඳහා ඉටු කළ යුතු චාරිත්‍ර නොපිරිහෙළා ඉටු කරමින් 2022.08.07 වැනි දින පූජ්‍ය ගල්ගමුවේ සන්තබෝධි හිමියන්ගේ පිරිත් සජ්ජායනාව මධ්‍යයේ බෞද්ධාලෝක පදනමේ සභාපතිවරයා සහ සාමාජිකයන් පිරිසක් ද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා හමුදා නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් ධාතු නිධානෝත්සවය සිදු කරන ලදී.

කුරුන්දි පුරාවිද්‍යා භූමිය ගවේෂණය කොට පුරාවිද්‍යාත්මක සාධක සහිත භූමිය පුරාවිද්‍යා භූමියක් ලෙස නම් කිරීම සඳහා මැනුම් කටයුතු මේ අතරතුරවාරයේදී සිදු විය. එහි දී දෙමළ ජනතාවගේ වගා බිම් අක්කර 600ක් බෞද්ධ විහාරයකට දෙන බවට අසත්‍ය ප්‍රකාශ කර දෙමළ ජනතාව උසිගැන්වීම හේතුවෙන් ඇති වූ අර්බුදකාරී වාතාවරණය හමුවේ නිලධාරීන්ගේ ආරක්ෂාව ගැන සලකා බලා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා සංරක්ෂණ කටයුතු නවතාලීමට නියෝග කිරීමෙන් නැවත සංරක්ෂණ කටයුතු ඇණ සිටියේය. ඉන් අනතුරුව ද විවිධාකාර විරෝධතා හා බාධා මධ්‍යයේ මිනින්දොරු දෙපාර්තමේන්තුවේ විශේෂ මැනුම් ඒකකයේ නිලධාරින් විසින් 2023 පෙබරවාරි මස මැනුම් කටයුතු අවසන් කිරීම සිදු කරන ලදී.





ස්තූපයේ ධාතු නිදන් කිරීම

ඒ.ආර්. 673/18 යටතේ ගොනු කළ සාමය කඩ වීමට අදාළව පවරා තිබූ නඩුව පිළිබඳව මුලිතිව් අධිකරණය දන්වා සිටියේ එම අංකය යටතේ පවත්වාගෙන යාමට නෛතික බලයක් නැති බවත්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීන්දුව මහෙස්ත්‍රාත් අධිකරණයට අභියෝග කළ නොහැකි බවත්ය. මේ පිළිබඳ තීන්දුව 2022 ඔක්තොබර් මස 27 වැනි දිනට නියම කර තිබුණ ද, එය නොවැම්බර් 24 ට කල් දමනු ලැබීය. 2022 ජූලි මස 19 වැනි දින ලබා දුන් තීන්දුව පරිදි පුරාවිද්‍යා කටයුතු කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවසර ලැබිණි.

මේ අනුව අතීතයේ පුරාවිද්‍යා ස්ථානය අත්හැරී යෑමෙන් පසු ප්‍රථම වරට මෙම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කරණු ලබන්නේ මෙම අවස්ථාවේදීය. එහිදී පළමුව දාගැබ කැණීම් කොට සංරක්ෂණය කළ අතර දෙවනුව පිළිමගෙය කැණීම් කර මේ වන විට සංරක්ෂණය කිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී.



ස්තූපයේ සංරක්ෂණ කටයුතු අතරතුර







ස්තූපය සංරක්ෂණයෙන් අනතුරුව




ස්තූපයේ කැණීමේ අවස්ථා



ස්තූපයේ කැණීමේ අවස්ථා



ස්තූපයේ සංරක්ෂණ අවස්ථා



ස්තූපයේ සංරක්ෂණ අවස්ථා



ස්තූපය සංරක්ෂණ කිරීමෙන් පසු

# 4. පරිච්ඡේදය

# සංඝාරාම සංකීර්ණය

**දාගැබ**

මෙම දාගැබ පිහිටා ඇති කඳු මුදුන එහි පාමුල සිට දළ වශයෙන් අඩි 200 ක් පමණ උසකින් යුතු අතර එහි සමතලා වූ මතුපිට භූමිය මීටර් 110x100 ප්‍රමාණයේ දිග පළලින් යුතු ආයත චතුරස්‍රාකාර හැඩයකින් යුක්ත වේ. මෙම මළුව මුළුමනින්ම ස්වභාවිකවම එම හැඩයෙන් යුක්ත වුවක් නොවන අතර, ඇතැම් තැන්හි ගල් බැමි බැඳීමෙන් මළුව ඒ ආකාරයට සකස් කරගෙන තිබේ.

ස්තූපය පිහිටා ඇත්තේ මෙකී මළුවේ ඊසාන දිග කෙළවරේය. කබොක් ගලින් කළ සෘජුකෝණාශ්‍ර මළුවක් මත වූ දාගැබ ද තනා ඇත්තේ කබොක් ගලෙනි. දිග පළලින් මීටර් 20.5x18.5 වන මළුව උසින් මීටර් 1.5 ක් තරම් වේ.

එච්.සී.පී. බෙල් විසින් තම පාලන වාර්තාවේ "Cut Block" ලෙස මෙම පාෂාණ විශේෂය හඳුන්වා දී තිබේ. "Cut Block" යන්න පසුකාලීනව සිංහල ව්‍යවහාරයේ දී කබොක් වශයෙන් භාවිතයට ආ බව මින් පැහැදිලි වේ. එසේ වුවත් එහි විද්‍යාත්මක නාමය ලැටරයිට් (Laterite) ලෙස හඳුනාගත හැකිය.

2010 වසරේදී උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීමේ හා සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණ වාර්තාවට අනුව විවිධ ප්‍රමාණයේ වෘක්ෂලතාවන්ගෙන් වැසී ගිය මීටර් 6 ක පමණ උසකින් හා මීටර් 50 ක පමණ විෂ්කම්භයක් සහිත දාගැබක් ලෙස මෙය වාර්තාගත කර තිබේ (උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම හා සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණ වාර්තාව - 2010). මෙම ස්තූපයේ කැණීම් ආරම්භ කරනු ලැබූවේ වර්ෂ 2021 ජනවාරි 26 වනදාය. එම කැණීම ආරම්භ කරන විට ස්තූප ගොඩැල්ල මත මිල්ල, සේරු, මොර, වීර, වෙලං ආදී වූ ශාක හා පඳුරු වලින් වැසී තිබුණි. දාගැබ මුදුනේ ගර්භ අභ්‍යන්තරය දක්වා අනවසර කැණීමක් සිදුකර තිබූ අතර, එම කැණීම් ගඩොල් කැබලි ආදී ද්‍රව්‍යවලින් පුරවා වසා දමා තිබිණි (මුලතිව් කුරුන්දි විහාර දාගැබ කැණීම් ව්‍යාපෘති වාර්තාව 2021:19)


කැණීම් ආරම්භ වන අවස්ථාවේදී ඉහත කී උසින් වූ ගොඩැල්ල වටා වර්ග මීටර් 150 ක දුරකට එහි නටබුන් විසිරී ගොස් තිබූ බව පෙනේ. ස්තූපයේ උඩට ඇද දමා තිබූ කබොක් ගල් නිසා මුලදී මෙය දාගැබක් ලෙස පැහැදිලි නොවූ නමුත්, පසුව එය දාගැබක් බවට තහවුරු කරගන්නා ලදී. ඉහත කැණීම් විස්තරයට අනුව, ගොඩැල්ල මත අධික ලෙස ගස්වැල් වැවී තිබීමෙන් දාගැබ පාදා ගැනීම අසීරු කටයුත්තක් වී තිබුණ ද කැණීම ආරම්භයෙන් මාස දෙකහමාරක් වැනි කෙටි කාලයක දී එහි කැණීම් අවසන් කිරීමට හැකියාව ලැබී තිබේ. මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මෙන්ම ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක බලකායේ ශ්‍රම දායකත්වය ද ලැබිණි.

ස්තූපයේ කළ කැණීම් මගින් අනාවරණය වී ඇත්තේ අවස්ථා කිහිපයක දී නිදන් හොරුන් විසින් දාගැබ හාරා එහි තිබූ පුරාවස්තු කොල්ලකා ඇති බවයි. එසේ වුවත් එහි වූ ධාතු ගර්භයේ බිත්තිවලට අයත් බදාම කොටස් ද රන් ආලේපිත කුඩා ලෝහ

මංජුසාවක කැබැල්ලක් ද සොයා ගනු ලැබිණ (මුලතිව් කුරුන්දි විහාර දාගැබ කැණීම් ව්‍යාපෘති වාර්තාව 2021:38). මෙම නටබුන් අතර තිබී බිත්ති මුහුණත්වලට යොදනු ලබන සැරසිලි කළ ගඩොල්, මැටි බඳුන් කැබලි, ලෝහ කාසි, පෙති උළු, නිල් පැහැති වීදුරු බඳුන් කැබැල්ලක් හා ලෝහමය මිණි ගෙඩියක් ද හමු වී තිබේ. එමෙන්ම මෙම පාදා ගැනීම්වලින් කැබලි කිහිපයකට කැඩී ගිය යූපගලක්, ගලින් කළ මල් ආසනයක් හා එහි පාදස්ථලය ද විවිධ හැඩවලින් යුතු කබොක් ගල් සහ වෙනත් ගඩොල් වර්ග ද හමු වී ඇත.



ස්තූප වේදිකාව



ස්තූප මළුවට ප්‍රවේශවන දොරටුව

දාගැබ පිහිටි සෘජුකෝණාස්‍ර මළුවට පිවිසීමට එහි දකුණු දිශාවෙන් ද්වාර මණ්ඩපයක් දක්නට ලැබේ. ගලින් කළ උළුවස්සකින් ඇතුළු වූ පසු දෙපසට විහිදෙන ශිලාමය පියගැට පන්ති දෙකකින් මළුවට ප්‍රවිශ්ට විය හැකිය. ඉහත කී ශිලාමය උළුවස්සෙහි දැනට ඉතිරි වී ඇත්තේ කුළුණු දෙක සහ යටලිපත පමණි. මෙහි නිර්මාණකරණය අනුව මුලදී මෙම ස්ථානයේ පියස්සක් තිබුණු බව අනුමාන කළ හැකිය. මේ ආසන්නයෙන් හමුවන පෙති උළු කැබලි අනුව ඒ බව තවදුරටත් සනාථ කරගත හැකි අතර, ස්තූප මළුවකට ප්‍රවේශවීම සඳහා කරන ලද මෙවැනි ද්වාර මණ්ඩපයක් මෙරට වෙනත් කිසිදු තැනකින් හමු වී නොතිබීම ද විශේෂත්වයකි.

ස්තූප වේදිකාවේ පිටත මුහුණතෙහි කබොක් ගලින් ම කරන ලද හිටි ඉරියව්වෙන් යුතු හස්ති රූපවල සලකුණු දක්නට ලැබේ. සෙ.මී. 60 ක් පමණ උසින් යුතු සිටගෙන සිටින ආකාරයෙන් වූ මෙම හස්ති රූප, සෙ.මී. 60 ක පමණ එකිනෙකට දුරින් පිහිටා තිබේ. රූප දෙකක් අතර, අර්ධ උන්නත කුළුණක් ද යොදා තිබේ. මෙම හස්ති රූප සහිත වේදික බිත්තිය ස්තූප වේදිකාව තැනූ කාලයට වඩා පසු කලෙක කළ බව ද පෙනේ. බොහෝ තැන්වලින් එය පහලට තල්ලු වී ගොස් තිබුණු අතර, එය පැරණි බැම්මට සම්බන්ධව තනා තිබූ බවක් නොපෙනේ. මෙම හස්ති රූප සහිත බැම්මේ ඇතැම් තැනෙක පැරණි බදාම කොටස් ද ඉතිරි වී තිබෙනු දක්නට ලැබිණි.




ස්තූප වේදිකාවේ පිටත මුහුණතෙහි වූ හස්ති රූප

වේදිකාව මත වූ දාගැබ වටා මීටර් 2 ක් පමණ පළලින් යුතු සලපතල මළුවක් දක්නට ලැබේ. එහෙත් එයට අයත් ගල් පුවරු සම්පූර්ණ දාගැබ වටා අතුරා තිබූ බව නොපෙනෙන අතර, එම සකස් කිරීම ද පසුකාලීනව සිදුවූවක් බව පැහැදිලි කරගත හැකි වේ.


ස්තූප මළුවේ සිට කුමුද බොරදමකින් ආරම්භ වන දාගැබ සඳහා මුළුමනින් ම කබොක් ගල් භාවිතයට ගෙන ඇති අතර, එම බොරදම් ගල් අවශ්‍ය ආකාරයට හැඩතල ගන්වා තිබේ. කුමුද බොරදමේ සිට තරමක් ඉහළට ගඩොල්වරි යෙදීමෙන් හා පැන්නුම් ගල් යෙදීමෙන් ස්තූපයේ පේසාවළල්ල නිර්මාණය කර තිබේ. එම පේසාවලල්ලේ සිට නැවත කුමුද බොරදම් යෙදූ පාදයක සිට ඉහළට නැංවූ ගඩොල් වරි විශේෂ ආකාරයකට තනා ඇති අතර, එය පද්මයක පහලට නැමී ගිය පෙත්තක් ආකාරයේ වූ හැඩතලයකින් යුක්ත විය. එහි මුදුන ගර්භය දෙසට නැමී යන අතර, එතැන්හි සිට ගඩොල් වරි දෙකක් පමණ යෙදීමෙන් අනතුරුව නැවත පිටතට පැන්නූ බොරදමක් සහිත ගැටියක් දක්නට ලැබේ. පැහැදිලිවම මෙය පේසා වළල්ල මත වූ විශාල පද්මයක හැඩතලක් බවත්, මෙවැනි ආකාරයක ලක්ෂණ මෙරට වෙනත් කිසිදු

දාගැබක දක්නට නොලැබෙන බවත් පවසන මහාචාර්ය මාලිංග අමරසිංහ මෙම දාගැබ මෙරට හමුවන එකම පද්මාකාර දාගැබ බවට අදහස් කරයි. එසේම පද්මාකාර ස්තූප ලෙස මහාචාර්ය පරණවිතාන අදහස් කළ ඇතැම් ස්තූප, මෙවැනි ලක්ෂණවලින් සමන්විත නොවන බවත්, කුඩා පද්ම බොරදම් යෙදූ පමණින් එම ස්තූප පද්මාකාර ස්තූප ගණයට අයත් නොවන බවත් මහාචාර්ය මාලිංග අමරසිංහ සඳහන් කරන අතර ඒ අනුව මෙම ස්තූපයේ ගර්භයේ ස්වරූපය ද එකී පද්මාකාර හැඩයට අනුරූපව තිබෙන්නට ඇතැයි ද වැඩිදුරටත් සඳහන් කරයි. ස්තූපයේ නිර්මාණාත්මක ස්වරූපය අනුව දැනට දක්නට ලැබෙන ලක්ෂණ ක්‍රි.ව. 7-9 සියවස්වලට අයත් යැයි අනුමාන කළ හැකිය.


ස්තූපය එහි පැරණි ස්වරූපයට නැවත සංරක්ෂණය කෙරෙන අතර, ඒ සඳහා පැරණි කබොක්ගල් මෙන්ම ඊට සමානව තනා ගන්නා ලද කබොක් ගල් භාවිතයට ගෙන තිබේ. පුරාවිද්‍යා සංරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව යූපගල ස්තූපවල දක්නට ලැබෙන ආකාරයේ ආකෘතියකින් ස්තූපයේ සංරක්ෂණ කටයුතු සිදුකොට ඇති අතර, එය සංරක්ෂණය කිරීමෙන් පසු පැරණි ස්වරූපයෙන්ම දැකගත හැකි ආකාරයට තහවුරු කොට ඇත.





සැලසුම් අංක 1 - දාගැබෙහි බිම් සැලැස්ම




සැලසුම් අංක 2 - දාගැබෙහි හරස් කැපුම (කැණීමෙන් පසු)




සැලසුම් අංක 3 - දාගැබෙහි පැති පෙනුම (සංරක්ෂණයෙන් පසු)




සැලසුම් අංක 4 - දාගැබෙහි හරස් කැපුම (සංරක්ෂණයෙන් පසු)

**පිළිමගෙය**



පිළිමගෙයි කැණීම් ආරම්භ කළ අවස්ථාව



2010 වර්ෂයේදී පිළිමගෙය දිස්වූ අයුරු

ස්තූපයට නිරිත දිශාවෙන් මීටර් 65 පමණ දුරින් පිළිමගෙය පිහිටා තිබේ. බෙල් මහතා ද තම වාර්තාවේ මෙය පිළිමගෙය විය හැකි බව පවසා ඇත. මීටරයක් උස් වේදිකාවක් මත ඉදිකර ඇති පිළිමගෙයි ප්‍රවේශ ද්වාරය නැගෙනහිර දිශානුගතව පිහිටා ඇත. දිග මීටර් 28 ක් ද පළල මීටර් 5 ක් ද වේ. මණ්ඩපය, අන්තරාලය හා ඇතුල් ගෘහය යන කොටස් වලින් යුක්තය. ඒවා පිවිසුම් ද්වාර මගින් ක්‍රමයෙන් ඉස්සෙන මණ්ඩපයන්ගෙන් යුතු වේ. පිළිම ගෙයට ප්‍රවේශ වීම සඳහා සඳකඩපහන, කොරවක්ගල් සහ පියගැට පන්තියකින් යුත් අලංකාරවත් පිවිසුමක් දක්නට ලැබේ. බෙල් මහතා පිළිමගෙය වාර්තා කරන විටත් මෙහි මුරගල් තිබී නැත. මෙම ප්‍රවේශයෙහි කොරවක්ගල්, සඳකඩපහන හා පියගැට පෙළට හානිවන ලෙස අනවසර කැණීමක් සිදු කොට ඇත. එම ස්ථානයේ මීටර් 3 කට ආසන්න ගැඹුරක් සහිත වළක් වන අතර සඳකඩපහනට හා කොරවක්ගල් කඩා දමා හානි සිදුකර, පියගැට පෙළ ද ගලවා ඉවත් කර ඇත.

2010 වසර වන විට මෙහි සඳකඩපහන කඩා ගලවා නොතිබුණු නමුත්, පියගැට පෙළ ගලවා තිබූ බව පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව වාර්තා කර ඇත . සඳකඩපහන පළාපෙති මෝස්තරයකින් සහ පියුමකින් පමණක් අලංකාර කර ඇති අතර, මෙය අනුරාධපුර යුගය නියෝජනය කරන සඳකඩපහනක් ලෙස හැඳින්විය හැකිය. සඳකඩපහන කොටස් කිහිපයකට කඩා දමා ඇති අතර එම ස්ථානයේ හාරන ලද වලෙහි ප්‍රමාණය පිළිවෙළින් දිග, පළල හා ගැඹුර මීටර් 1.8, 1.6 හා 2.6 ක් විය. කොරවක්ගල්වල ඉහළ කොටස් ද කඩා දමා තිබෙන අතර, පියගැට 5 කින් සමන්විත

පියගැට පෙළෙහි වූ පියගැට 4 ක් කඩා දමා ඇත. පියගැට පෙළ අරිම්බුව සහිත අලංකාර ලීස්තර මොස්තරයකින් අලංකාර කර තිබේ.



2010 වර්ෂයේදී පිළිමගෙයි පියගැට පෙළ දිස්වූ අයුරු



පිළිමගෙයි කැණීමෙන් අනාවරණය කරගත් පිළිමගෙයි ඉදිරිපස වූ පියගැටපෙළ

උක්ත පියගැට පන්තිය තරණය කිරීමෙන් අන්තරාලයට ද අන්තරාලයෙන් පසුව තවත් පියගැට පන්තියක් මතින් ඇතුල් ගෘහයට ද පිවිසිය හැකිය. කැටයම් රහිත සඳකඩපහනකින්, දෙපසින් වූ මුරගල් දෙකකින් හා කොරවක්ගල් දෙකකින් ද සමන්විත වෙයි. මුරගල් වල ඉහළ කොටස් කඩා දමා ඇති අතර ඒවායෙහි පහළ කොටස් පොළොව මට්ටමේදී දැකිය හැකිය. කොරවක් ආදිය කඩා දමා තිබේ. කොරවක්ගල්වල මකර කැටයම හා මුවෙන් නිකුත්වන ලියවැල් මෝස්තරය ද වේ.



පිළිමගෙයි ගල් උළුවස්ස

ඇතුල් ගෘහයට ප්‍රවේශවන දොරටුව සඳහා ගල් උළුවස්සක් තිබී ඇත. උළුවස්සෙහි උඩලිපත අලංකාර ගල් කැටයමකින් යුක්ත වූවකි. එය දැනට අන්තරාලය මත වැටී තිබේ. එම කැටයම දුර්ලභ කැටයමකි. මේ පිළිබඳව බෙල් මහතාගේ වාර්තාවේ ද සඳහන් කර ඇත. මෙම කැටයම් අතර ඉහළ පේළියෙහි මකර මුඛයෙන් නික්මෙන පිරිමි සහ කාන්තා යුගල රූප කට්ටල කිහිපයක් ද එම යුගල රූප දෙස බලා සිටින බහිරව රූපයක් ද වෙයි. මේ ආකාරයේ කැටයමක් විජයාරාම ආරාම සංකීර්ණයේ වූ ගෙඩිනැගිල්ලක ද පිරිමි සහ කාන්තා යුගල රූපයන්හි ශරීරය හොඳින් මතු කර දක්වා ඇති අතර, ජටාමකුටය සහිත හිස් පළඳනාවකින් ඔහුගේ හිස ආවරණය කර ඇත. බෙල් මහතා මෙහි ජටාමකුටය උඩට ඉස්සුණු අමුතුම තොප්පියක් ලෙසත් මෙහි මිථුන රූප බහිරව යුගල ලෙසත් හඳුන්වා ඇත.





උළුවස්සෙහි උඩලිපත වූ අලංකාර ගල් කැටයම

පිළිමගෙය තුළ ඉතා මෑත කාලීනව දෙවියන් සඳහා පුද පූජා සිදු කිරීම වෙනුවෙන් යම් සැකසීමක් සිදුකර ඇති බව පෙනේ. පුරාවස්තු වනසන්නන්ගේ අතින් කඩා බිඳ දමන ලද කොරවක් ගලෙහි කැබැල්ලක් ද ගෙනැවිත් තබා මෙහි වැඳුම් පිදුම් කිරීම සිදුකර තිබෙන බව කැණීම් කටයුතු පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද වාර්තාවන්හි  සඳහන් වෙයි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022).

ආයත චතුරස්‍රාකාර වේදිකාව කබොක්ගලින් නිර්මිත බව හා  වේදිකාවෙන් වටවන අභ්‍යන්තර භූමිය බොරලුවලින් පුරවා පුලුස්සන ලද ගඩොල් සහ ගල් කණු භාවිතයෙන් ඉදිකර ඇති බව කැණීම් මගින් අනාවරණය වේ.  පිළිමගෙය සඳහා යොදන ලද ගල් කණු සහ ලී ආධාරයෙන් පියස්ස සකස්කර පෙති උළු සෙවිලි කරන්නට ඇති බව පිළිමගෙය තුළ සහ ඒ වටා ප්‍රදේශයෙහි දක්නට ලැබෙන පෙති උළු සාධක සපයයි. ඊට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද කැණීමේ දී හමු වී ඇති කම්මල් යකඩ ඇණ පන්සියයකට වැඩි ප්‍රමාණයක් පියස්ස සඳහා යෙදූ ඒවා විය හැකි බව වාර්තා කර තිබේ. (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022).

ගල්කණු මැදිවන ලෙස ගඩොලින් බඳින ලද බිත්ති හුණු පිරියම් කර තිබූ බව පැහැදිලි වෙයි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). අන්තරාලයෙහි ගෙබිම සඳහා ගල් පුවරු යොදා ගෙන තිබෙන අතර, ඒවායෙහි නිශ්චිත ප්‍රමාණයක් හෝ හැඩයක් දක්නට නොලැබේ. උතුරු දිශාවට ප්‍රවේශය සැලසෙන දොරටුවක් ද මෙම ගෘහයෙහි වේ (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022).




කැණීම් කටයුතු සිදුකරමින්

ගර්භගෘහය දිග හා පළල මීටර් 9.8X9.6 ක් වන චතුරස්‍රාකාර ඉදිකිරීමකි. එම ගෘහ අභ්‍යන්තරය තුළ ගමන් කළ හැකි පරිදි ප්‍රදක්ෂිණාපථයක් දැකිය හැකිය. මෙහි ගෙබිම අසමාන ගල් පුවරු අල්ලා ඒ මත බදාමයක් යොදා තිබූ බව තහවුරු වන සාධක කැණීම මගින් හඳුනාගැනීමට හැකියාව තිබුණි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). මෙම පිළිම ගෙය අනුරාධපුර යුගයේ ඉදිකරන ලද්දක් බව දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධකයන්ගෙන් නිගමනය කළ හැකිය.


පිළිමගෙය කැණීම පිළිබඳ ව වූ වාර්තාවට හා මීට පෙර සිදුකරන ලද පර්යේෂණයන්ට අනුව මෙම ස්ථානයෙන් ගලින් කළ බුද්ධ ප්‍රතිමා තුනක් සහ බෝධිසත්ව ප්‍රතිමා දෙකක් ද සොයා ගෙන තිබේ.




පිළිමගෙය කැණීම් කිරීමෙන් පසු




සැලසුම් අංක 5 - පිළිමගෙයි බිම් සැලසුම




සැලසුම් අංක 6 - පිළිමගෙයි ඉදිරි සහ පැති පෙනුම




සැලසුම් අංක 7 - පිළිමගෙයි හරස් කැපුම



පිළිමගෙය කැණීමේ අවස්ථා




පිළිමගෙය කැණීමෙන් පසු

## හිටි බුද්ධ ප්‍රතිමාව



කැණීමෙන් මතු වූ හිටි බුද්ධ ප්‍රතිමාවෙහි කොටසක්

මෙම ප්‍රතිමාව ආන්ද්‍ර කිරිගරුඬ නමින් හඳුන්වනු ලබන තද හුණුගල් වර්ගයේ පාෂාණයෙන් නිර්මිත හිටි බුද්ධ ප්‍රතිමාවක් ලෙස සැලකේ. ප්‍රතිමාව සිටුවීමට සැකසූ එම පාෂාණයෙන් ම කරවන ලද පද්මපීඨයක් ද වේ. කැණීම් වාර්තාවට අනුව ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයෙන් හෝ වෙනත් රටකින් මෙරටට පාෂාණය ගෙනවිත් මෙරට දී ප්‍රතිමාව නිර්මාණය කරන්නට ඇති බව අනුමාන කරයි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). ඇතැම් විට මෙම ප්‍රතිමාව විදේශීය ශිල්පීන් විසින් මෙරටදීම කරවන්නට ඇතැයි ද අනුමාන කළ හැකිය. මෙම පාෂාණ වර්ගයෙන් නිමවූ ප්‍රතිමා මේ වන තෙක් මෙරටින් හමු වී නැත. කඩා දමන ලද බුද්ධ ප්‍රතිමාවෙහි පාද ප්‍රදේශය, පාද ප්‍රදේශයට ඉහළින් වූ ප්‍රදේශයේ කොටසක්, මුහුණ ප්‍රදේශයේ කොටසක් කැණීම මගින් අනාවරණය කරගෙන ඇති අතර, ලැබුණු ප්‍රතිමා කොටස් අනුව අඩි 5 කට වඩා වැඩි උසකින් යුක්ත ප්‍රතිමාවක් වන්නට ඇති බවත් වාර්තා වෙයි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). ප්‍රතිමා ගෘහයේ ප්‍රධාන ප්‍රතිමාව ලෙස මෙම බුද්ධ ප්‍රතිමාව ව්‍ය. ව. 3-4 සියවස් නියෝජනය කරන නිර්මාණාත්මක ලක්ෂණයන්ගෙන් යුක්ත වූවක් ලෙස සඳහන් වෙයි (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). ප්‍රතිමා පාදම මල් මෝස්තරයකින් අලංකාර කර ඇත. එහි පාද යෙදීම සඳහා සිදුරක් වේ. එම සිදුරට පිටුපසින් වෘත්තාකාර සිදුරක් වන අතර, එය බුද්ධ ප්‍රතිමාවට ඡත්‍රයක් සවි කිරීමට යෙදූවක් විය හැකිය.




කැණීමෙන් හමු වූ හිටි බුද්ධ ප්‍රතිමාවෙහි මුහුණ කොටස



කැණීමෙන් හමු වූ පිළිම පාදම සහිත හිටි බුද්ධ ප්‍රතිමාවෙහි කොටස් සහ එම කොටස් ඇසුරින් ප්‍රති නිර්මාණය කළ බුද්ධ ප්‍රතිමාව

## හිඳි බුද්ධ ප්‍රතිමාව

මෙම ප්‍රතිමා ගෘහය තුළින් අඩි 1 1/2 ක් උසැති හිස රහිත බුද්ධ ප්‍රතිමාවක් හමු වී ඇත. මෙය ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මාණය කරන ලද ප්‍රතිමාවකි. මෙම ප්‍රතිමාව විදේශයක නිර්මාණය කර මෙරටට ගෙනෙන ලද සමාධි ප්‍රතිමාවක් ලෙස අනුමාන කළ හැකිය.



කැණීමෙන් හමු වූ හිඳි බුද්ධ ප්‍රතිමාව



1970-77 පුරාවිද්‍යා පාලන වාර්තාවෙහි දක්වා තිබෙන කුරුන්දන්මලේ ස්ථානයෙන් හමු වූ බුද්ධ ප්‍රතිමාව


## බෝධිසත්ව ප්‍රතිමා ද්විත්වය

අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමා ද්විත්වයක් වන කුමාර සහ යෝගී යන අවලෝකිතේශ්වර බෝධිසත්වරුන් ලෙස හඳුනාගත හැකිය. මෙම ප්‍රතිමා ක්‍රි.ව. 8 - 9 සියවස් නියෝජනය කරන ස්ඵටික හුණු ගලින් නිමවූ බෝධිසත්ව ප්‍රතිමා දෙකකි. රාජකීය ආභරණයෙන් විභූෂිත අවලෝකිතේශ්වර ප්‍රතිමාවන්හි රාජකීය වස්ත්‍ර සහ අනගි ආභරණ නම් හර, කේයුර, කන්කන, නූපුර සහ කර්ණකුණ්ඩල වේ. යෝගී අවලෝකිතේශ්වර ප්‍රතිමාවන්හි යෝගී ශෛලිය වන අතර එය හඳුනාගත හැකි තවත් ලක්ෂණ ලෙස ජටාමකුටයක් හා අජින ද, මෘර්ග හෝ කොටියෙකු, දිවියෙකු වැනි සතෙකුගේ හමක් ඉණවටා දෝතියට උඩින් බැඳ තිබේ. යෝගී අවලෝකිතේශ්වරයන්ගේ කොණ්ඩයේ කෙස් රොද දෙකක් උරහිස් මතට වැටී ඇත. මෙම ස්ථානයෙන් හමුවන යෝගී අවලෝකිතේශ්වරයන්ගේ ඉණ වටා දවටා ඇති දිවියෙකු හෝ කොටියෙකු වැනි සත්ව හමෙහි සත්වයාගේ මුහුණ හොඳින් දැකගත හැකි වෙයි. මෙය අප රට සාමාන්‍යයෙන් හමුවන ප්‍රතිමා හා සමාන බව කිව හැකිය. යෝගී අවලෝකිතේශ්වරයන්ගේ උඩුකය නිරුවත්ය. ආභරණවලින් අලංකාර වී නොමැත. පපුව උඩින් විකර්ණව දිවයන යෝගී ස්වභාවය පෙන්වන පූන නූලක් වේ. ආභරණ රහිත යෝගී හා ආභරණ සහිත කුමාර අවලෝකිතේශ්වර අතර වෙනස මෙහිදී පැහැදිලිව හඳුනාගත හැකිය. අවලෝකිතේශ්වර ප්‍රතිමා ද්විත්වයෙන් කුමාර අවලෝකිතේශ්වර ප්‍රතිමාවෙහි හිස පමණක් කැණීම මඟින් අනාවරණය වී ඇති අතර, යෝගී අවලෝකිතේශ්වර ප්‍රතිමාවට අයත් කොටස් කැඩී ගොස් තිබුණ ද ප්‍රතිමාව ම හමු වී ඇත. මෙම ස්ථානයෙන් හමුවන ප්‍රතිමාවන්ට අයත් කොටස් අතර කැඩුණු අත් හා පිළිමයෙහි පාදම් හා බැදෙන පාද කොටස් ද වේ. බෝධිසත්ව ප්‍රතිමා ද්විත්වය සඳහා යෙදූ පිළිම පාදම් ද මේ අතර වේ. ඒවා නෙලුම් මල් කැටයමින් අලංකාර කර ඇත.

අවලෝකිතේශ්වර ප්‍රතිමා දෙක බුද්ධ ප්‍රතිමාවට දෙපසින් පිහිටුවා තිබී ඇත. එවැනි නිදසුන් ලංකාවේ දක්නට ලැබෙන්නේ කිහිපයක් පමණි. ඊට නිදසුන් ලෙස මුහුදු මහාවිහාරය, සිතුල්පව්ව සහ තිස්සමහාරාම ආදී ස්ථාන දැක්විය හැකි ය. (Bopearachchi, 2014, p. 171-8). මෙම ප්‍රතිමා දෙක පැහැදිලිවම 8-9 සියවස් නියෝජනය කරනු ලබන බවත්, ප්‍රධාන පිළිමය නැවත වරක් තබා දෙපසින් මෙම ප්‍රතිමා දෙක තබන්නට ඇති බවත් මහාචාර්ය ඔස්මන් බෝපෙආරච්චිගේ අදහසයි. මේ බව සනාථ වනුයේ හිටි බුද්ධ ප්‍රතිමාව තැන්පත් කර තබන්නට ඇතැයි විශ්වාස කරන යන්ත්‍රගල තිබූ ස්ථානය කැණීමේදී සොයා ගන්නා ලද අෂ්ඨ මංගල වස්තුන්ගෙන් කිහිපයක් ලෙස ගැනෙන ධර්ම චක්‍රය, සංඛය, ධජය ආදිය මෙහි තිබූ යන්ත්‍ර ගලෙහි තැන්පත් කර තිබෙන්නට ඇති බව සිතිය හැකිය. ඔහුගේ අදහස 8-9 සියවසේදී යන්ත්‍රගල, අෂ්ඨ මංගල වස්තූන් සමග අලුතින් පිළිමගෙයට එක්කරන්නට ඇති බවයි. ඒ අනුව එම අවධියෙහි දී පිළිමගෙය නවීකරණයට ලක් කර ඇත.



බෝධිසත්ව ප්‍රතිමාවේ ශීර්ෂය



අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව සහ ශීර්ෂය

මෙම ස්ථානයේ සිදුකරන ලද කැණීමෙන් අනාවරණය කරගත් පුරාවස්තු බොහොමයක් වෙයි. ඒවා අතර බ්‍රහ්මයෙකු, යෝගියෙකු හෝ බෝධිසත්වයෙකු ලෙස අනුමාන කළ හැකි කුඩා ප්‍රතිමාවක් වෙයි. අෂ්ඨ මංගල වස්තු අතරට ගැනෙන එක් අංගයක් ලෙස මෙම ස්ථානයෙන් හමුවන ධජය හඳුනාගත හැකිය. යම් ලෝහයකින් සකසන ලද එහි දණ්ඩ දැනට ඉතිරිව ඇති අතර, ධජ කොටස කැඩී ගොස් ඇත. මෙය යන්ත්‍ර ගල තුළ තැන්පත් කර තිබී ඇති බව විශ්වාස කළ හැකිය. ඊට අමතරව තැටිය හෝ පාත්‍රයක් ලෙස අනුමාන කළ හැකි ලෝහමය නිර්මාණයකි. භද්‍රපීඨය ලෙසින් හැඳින්වෙන මෙම ලෝහමය නිර්මාණය අෂ්ඨ මංගල වස්තු අතරට ගැනේ. චක්‍රය ලෙස හැඳින්වෙන ලෝහමය නිර්මාණය අෂ්ඨ මංගල වස්තු අතර එක් අංගයක් වන අතර, එය මෙම පිළිමගෙයි කැණීම තුළින් අනාවරණය විය. මෙය ගරාදි 15 කින් යුක්ත වන අතර, ඉතාම අලංකාර නිමැවුමක් ලෙස හැඳින්විය හැකිය. ඡත්‍රයක් හෝ පහනක ඉහළ කොටසක් ලෙස සිතිය හැකි වෘත්තාකාර නිමැවුමකට අයත් කැඩී ගිය කොටස් 2 ක් මෙම ස්ථානයේ තිබී හමුවී තිබේ.



කුවේර හෝ බ්‍රහ්ම ලෙස අනුමාන කළ හැකි ලෝහමය මූර්තියක් ද වේ.



පිළිමගෙයි කැණීමෙන් හමුවූ ලෝහමය අෂ්ඨමංගල වස්තූන්



පිළිමගෙයි කැණීමෙන් හමුවූ ලෝහමය අෂ්ඨමංගල වස්තුන්



පිළිමගෙයි කැණීමෙන් හමුවූ ලෝහමය මූර්තියක්







පිළිමගෙයි කැණීමෙන් හමුවූ බෝසත්රුවක් ලෙස අනුමාන
කළහැකිලෝහමය මූර්තියක්

මෙම කැටයම හොඳ තත්ත්වයක නොමැති නිසා නිශ්චිත අර්ථකථනයක් දීමට අපහසුය. ප්‍රථමයෙන්ම නිරීක්ෂණය කළ හැක්කේ එය සාදා ඇත්තේ තද ආන්ද්‍ර හුණුගල් වලින් බවයි. එහි ශෛලීය ලක්ෂණ දෙස බලන විට, එය සම්මත වර්ෂ හතරවන සහ පස්වන සියවස්වල අග භාගයට අයත් බව කෙනෙකුට පැවසිය හැක. මෙම කැටයම හමුවූ කුරුන්දිමලේ අඩවියේ තිබී හමුවූ බුද්ධ ප්‍රතිමාවක කොටස් ද ආන්ද්‍ර ප්‍රදේශයෙන් ආනයනය කළ ඒවාය. එනම් කුරුන්දිමලේ තිබී හමුවූ කැටයම සහ බුද්ධ ප්‍රතිමාව යන දෙකම එකම යුගයට අයත් විය යුතුය, එනම්; සම්මත වර්ෂ හතරවන සහ පස්වන සියවස්වල අගභාගයට අයත් වන බව මහාචාර්ය ඔස්මන් බෝපෙආරච්චිගේ අදහසයි.

මෙම කැටයම බෝධිසත්ව අවලෝකිතේශ්වර සහ ඔහුගේ සහකාරිය වූ තාරාගේ මුල්ම නිරූපණයකි. බෝධිසත්ව අවලෝකිතේශ්වර, රාජකීය වස්ත්‍රවලින් සැරසී, ඉදිරිපස බලා සිටින අතර, ඔහු දකුණු අතින් නෙළුම් මලක් අල්ලාගෙන සිටී. ඔහුගේ වම් අත ඉණෙහි තබා ඇත. අවලෝකිතේශ්වරගේ දෙපස ඇති කාන්තා රූප දෙක, ඔහුගේ සහකාරියන් වූ සීතා තාරා (සුදු තාරා) හෝ ශ්‍යාම තාරා (කොළ තාරා) විය හැකිය. ඔහුගේ වම් පසින් සිටගෙන සිටින තැනැත්තිය බෝධිසත්වයන් දෙස නෙත් යොමු කරමින්, ශරීරයෙන් හතරෙන් තුනක් පමණ ඔහු දෙසට හැරී ඇත. ඇය දකුණු අතේ පිපෙන නෙළුම් මලක් අල්ලාගෙන සිටින අතර වම් අත ඇගේ වම් ඉණ මත තබා සිටී. බෝධිසත්වයන්ගේ දකුණු පැත්තේ සිටගෙන සිටින තාරා ද වම් අතෙහි පිපෙන නෙළුම් මලක් අල්ලාගෙන සිටින අතර ඇගේ දකුණු අත වම් ඉණට එරෙහිව අල්ලාගෙන සිටී. එය කිසිසේත්ම පැහැදිලි නැතත්, බෝධිසත්ව ත්‍රිත්වයට ඉහළින් පියාසර කරන රූප දෙකක් (මැදින් අවලෝකිතේශ්වර සහ දෙපසින් තාරා දෙදෙනෙක්) වන්දනාමාන කරමින් මල් විසිකරන බව සිතිය හැකි බව මහාචාර්ය



අවලෝකිතේශ්වර බෝධිසත්ව ඵලකයේ රේඛා සිතුවම

ඔස්මන් බෝපෙආරච්චි අදහස් දක්වයි (මහාචාර්ය ඔස්මන් බෝපෙආරච්චි සමඟ 2023-05-01 දින සිදුකළ සාකච්ඡාව හා බැඳේ). .





අවලෝකිතේශ්වර බෝධිසත්ව ඵලකය



පිළිමගෙයි කැණීමෙන් හමුවූ ටෙරාකොටා මූර්ති

කැණීම් වාර්තාවට අනුව පෙනී යන්නේ යම් ආක්‍රමණයක් හේතුවෙන් සම්පූර්ණ පිළිම ගෙය තුළ වූ ප්‍රතිමා සියල්ල ම විනාශ වීමෙන් අනතුරුව විහාරය අභාවයට යාමේ ප්‍රතිඵලයක් ලෙස පිළිම ගෙය ගරා වැටීමට ලක්වන්නට ඇති බවයි. ඒ බව තවත් තහවුරු වන බව පෙන්වා දෙමින් විනාශකරන ලද අවශේෂ මත ස්වභාවිකව ගරා වැටුණු ස්ථරවලින් යට වී ඇති බව වාර්තා කර ඇත (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022). එම තත්වය සත්‍ය වන්නේ නම් එවැනි ආක්‍රමණයකින් පසු කැණීම් කර පැහැදිලි ව හඳුනාගනු ලැබූ පළමු ස්මාරකය මෙම පිළිම ගෙය වන බව සඳහන් කළ හැකිය. කැණීම් වාර්තාවේ සඳහන් වන පරිදි ගර්භ ගෘහය තුළ ගරා වැටී තිබූ ස්ථරය පසුකාලීන ව නැවත හෑරීමකට ලක් ව ඇත. මෙම අනවසර කැණීම ගර්භ ගෘහය මධ්‍යයෙහි වූ ගෙබිම මත වූ බිම් ගල් ඇතිරුම ද  ඉවත් කරමින් අභ්‍යන්තරය තුළ සිදුකර තිබෙන අතර, එම අවස්ථාවේදී ගර්භයෙහි තුළ තිබූ ප්‍රතිමා සඳහා යොදන ලද පද්මපීඨ දෙක ද ඉවතට ඇද දමා තිබුණු බව වාර්තා කරයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද කැණීමේදී අඩි 1 1/2 ප්‍රමාණයේ කවන්ද හිඳි සමාධි බුද්ධ ප්‍රතිමා එම අනවසර කැණීමෙන් අවුල් වූ ස්ථරයෙන් හමුවී ඇත (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022).

අනවසර කැණීමට ලක්වූ වලෙහි පස් ඉවත් කිරීමෙන් පසු පෙනී යන්නේ එම කැණීම බොහෝ කලකට පෙර සිදුවූවක් බවයි. එයින් අනාවරණය වන පරිදි පිළිම ගෙයි ගෙබිමෙහි වූ කලුගල් පුවරුවලට යටින් ගඩොල් ඇතුරුමක් වන බවත්, එය පිළිම ගෙයි පැරණි අවධියක් බවත් තහවුරු කරයි. (මුලතිව් කුරුන්දි විහාර පිළිමගෙය කැණීම් ව්‍යාපෘති වාර්තාව 2022)



පිළිමගෙයි මධ්‍යය අනවසර කැණීමට ලක්වූ වලෙහි පස් ඉවත් කිරීමෙන් පසු

**පොහොයගෙය**

ස්තූපයේ සිට බටහිර දිශාවෙන් මීටර් 45 ක් පමණ දුරින් සාපේක්ෂ ප්‍රමාණයෙන් විශාල හා උසින් යුක්ත ගල්කණු භාවිතයෙන් නිමවන ලද ගොඩනැගිල්ලකි. ගොඩනැගිල්ලේ භාවිතාව හඳුනා ගැනීම අපහසු වුවත් මෙය පොහොයගෙය ලෙස අනුමාන කළ හැකිය. ගොඩනැගිල්ලේ දිග මීටර් 14.30 සහ පළල 8.20 ක් වන ප්‍රමාණය ආවරණය වන ලෙස පේළි කිහිපයක සිටුවන ලද ගල් කණු දක්නට ලැබෙන මෙම ස්ථානයේ එකිනෙකට සුලු වශයෙන් ප්‍රමාණයෙන් වෙනස් වන ගල් කණු භාවිතයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත. දැනට සිටුවන ලද ගල් කණු 07 ක් සහ කැඩී ගිය ගල් කණු කොටස් අවට ප්‍රදේශයෙන් දැකගත හැකිය. දැනට හඳුනාගෙන තිබෙන ස්මාරක අතර විශාලතම ගල් කණු භාවිතයෙන් කරන ලද ඉදිකිරීම වන මෙහි වූ කණුවක වට ප්‍රමාණය සෙ.මී. 33x37 උස සෙ.මී. 278 ක් ද වේ. බෙල් මහතාගේ වාර්තාවෙහි විහාරය ලෙස හඳුන්වා ඇත්තේ මෙම ගොඩනැගිල්ල බව තහවුරු කරගත හැකිය.



පොහොයගෙය

**නටබුන් ගොඩනැගිල්ල 01**

මෙම මළුව මත පිළිමගෙයට ඉදිරියෙන් දකුණු පසින් වූ (සමබිමෙහි දකුණු ප්‍රදේශයෙහි) සිටුවන ලද ගල් කණු දෙකකින් යුත් ගොඩනැගිල්ලකට අයත් නටබුන් දැකිය හැකිය. මෙම ඉදිකිරීමෙහි උපයෝගීතාවය හඳුනා ගැනීම අපහසුය. ගල් කණු දෙක නැගෙනහිර බටහිර දිශානුගතව මීටර් 1.95 ක පරතරයක් සහිත ව සිටුවා ඇත. ඉතා හොඳින් ඔපමට්ටම් නොකරන ලද මෙහි ගල් කණුවක වට ප්‍රමාණය සෙ.මී. 20x25 ද උස සෙ.මී. 45 ක් ද වේ.

**නටබුන් ගොඩනැගිල්ල 02**

උක්ත ගොඩනැගිල්ලට ඉදිරියෙන් දකුණු පසින් (සමබිමෙහි දකුණු ප්‍රදේශයෙහි) සිටුවන ලද ගල් කණු හතරකින් යුත් ගොඩනැගිල්ලක නටබුන් දැකිය හැකිය. දැනට ඉතිරි ව ඇති ගල්කණු වල ඉංග්‍රීසි අක්ෂර මාලාවේ "එල්" අක්ෂරයේ හැඩයට සමානය. මෙම ඉදිකිරීමෙහි උපයෝගීතාවය ද හඳුනා ගැනීම අපහසුය. විවිධ ප්‍රමාණයේ ඉතා හොඳින් ඔපමට්ටම් කරන ලද ගල් කණු 4 කින් යුත් ඉදිකිරීමක් වන මෙහි කණුවක වට ප්‍රමාණය 16x24 ක් උස සෙ.මී. 64 ක් පමණ ද වේ.

**බෝධිඝරය**

ස්තූපයට අමතර ව කඳු මුදුන මත වූ සමතලා භූමිය (මලුව) මත තවත් පැරණි ස්මාරක කිහිපයකි. ස්තූප ගොඩැල්ලේ සිට දකුණු දිශාවෙන් මීටර් 65 ක් පමණ දුරින් කවාකාර ආකාරයට ගල්කණු 10 සිටුවා ඇති අතර, මෙම ඉදිකිරීම බෝධිඝරය ලෙස අනුමාන කරයි (මුලතිව් කුරුන්දි විහාරයේ කැණීම් වාර්තාව 2021: 15). එම ගල්කණු සමාන පරතරයකට අනුව සිටුවා ඇති අතර, ඒවායේ සමහරක් කැඩී ගොස් ඇත. වෘත්තාකාර ගොඩැල්ල වටා කබොක් ගල් බැම්මක් දැකගත හැකිය. එම ගොඩැල්ලේ විශ්කම්භය මීටර් 10.6 ක් පමණ වන අතර එහි වූ කැඩීගිය ගල්කණුවල දැනට දක්නට ලැබෙන කණුවක ප්‍රමාණය සෙ.මී. 22x31 ක් පමණ වේ. උතුරු දිශාවට ප්‍රවේශය සකසා ඇති අතර එහි දැනට පියගැට 03 පමණ ඉතිරි ව තිබේ. පියගැටයක ප්‍රමාණය සෙ.මී. 40x25 ක් පමණ වේ. සමබිමෙහි තරමක් උස ගොඩැල්ලක් ලෙස මෙය දර්ශනය වන අතර ගොඩැල්ල මධ්‍යයෙහි ද සිටුවන ලද ගල් කණු 3 කි. බෙල් මහතා මෙම ගොඩනැගිල්ල වට-දා-ගෙය ලෙස හඳුන්වා ඇත.



බෝධිඝරය

**පැරණි පොකුණ**

පිළිම ගෙයට පසුපසින් සහ බටහිර ප්‍රාකාරයට පිටතින් මීටර් 10 ක් පමණ දුරින් පිහිටි විශාල පොකුණක් දැකිය හැකිය. දිගින් මීටර් 33 ක් හා පළලින් මීටර් 25 ක් වන එය ඕවලාකාර හැඩයෙන් යුක්තය. එහි ගැඹුර මීටර් 10 ක් පමණ වෙයි. ඉහළ මලුවේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම පොකුණ භාවිත වන්නට ඇත. මෙම පොකුණ ක්‍රමයෙන් සෝදාපාලුවට ලක්ව පස් පිරී ඇති බව පෙනේ.

දෙවන මාලයේ දක්නට ලැබෙන විශාලතම ඉදිකිරීම් අංගය ලෙස මෙම පොකුණ හඳුනාගත හැකිය. පොකුණට අමතරව සිටුවන ලද ගල්කණුවලින් සමන්විත ගොඩනැගිලි ඒ පිළිබඳ සාධක වේ. මෙම ඉදිකිරීම්වල උපයෝගීතාවය ඉතිරි ව ඇති සාධකයන්ගෙන් හඳුනා ගැනීමට අපහසුය.

ඉහළ මලුව සකසා වට ප්‍රාකාරය සැකසීමේදී මලුවෙහි ජලය රැස්වීම වැළැක්වීම සඳහා ජලය බැහැරට ගෙනයාමට සකසන ලද ගල් පිහිලි කිහිපයක් ද දැකිය හැකිය.



පොකුණ

**සෝපාන පන්ති**

සංඝාරාම සංකීර්ණය වෙත ප්‍රවේශවීම සඳහා උතුරු හා නැගෙනහිර දිශාවන් ඔස්සේ ප්‍රවේශ මාර්ග තිබූ බවට සනාථ කෙරෙන සාධක දැකිය හැකිය. උතුරු බෑවුම ඔස්සේ පර්වත මස්තකයට ප්‍රවේශවීම සඳහා පියගැට පන්තියකි. මෙම පියගැට පන්තිය කුරුඳුමලය වැව් බැම්ම අසල සිට තිබූ බවට සනාථ කරන සාධක හමු වන අතර, මාලක වශයෙන් සකස් කර ඇති මෙම ප්‍රවේශ පියගැට පන්තිය සඳහා කඳු පාමුල

ස්ථාන දෙකක දී ප්‍රවේශ මාර්ගයට මුරගල් යුගල දෙකක් එක්කර ඇත. මෙම මුරගල් යුගල පසින් වැසීගොස් ඇති අතර, ඒවායේ ඉහළ කොටස් සෙ.මී. 8 ක් පමණ මතුපිටට පෙනේ. පියගැට පන්තිය පිළිබඳව එච්. සී. පී. බෙල් මහතා විසින් 1905 පුරාවිද්‍යා පාලන වාර්තාව මගින් ද වාර්තා කර ඇත. වර්තමානයේ ද එම පියගැට පන්තිය පොළොවෙන් යට වී ඇති අතර, මුරගල් යුගල දෙක කන්දේ පහළ මට්ටමකදී හා මධ්‍ය මට්ටමකදී දැකගත හැකිය. පහළ මට්ටමේ දී පියගැට පන්තියේ ආරම්භය ලෙස සිතිය හැකි ස්ථානයේ මුරගල් අතර පරතරය මීටර් 4.5 ක් වේ. මෙහි වූ මුරගලක පළල සෙ. මී. 40 ක් ද පසින් යට වී ඇති කොටසින් ඉතිරි ව ඉහළට දැනට දක්නට ලැබෙන කොටසේ උස සෙ.මී. 17 ක් පමණ වේ. මුරගල් ආවරණය වන ප්‍රදේශයේ පියගැට පසට යට ව පවතින බව විශ්වාස කළ හැකි අතර, මුරගලෙහි දැනට දක්නට ලැබෙන සාධක අනුව අවම වශයෙන් පියගැට පන්තිය සෙ.මී. 50-70 ක් පමණ යටින් පවතිනු ඇතැයි සිතිය හැක. මෙම ස්ථානයේ සිට මීටර් 15 ක් පමණ දුරින් කන්දහෙි මධ්‍ය ප්‍රදේශයට වන්නට තවත් මුරගල් දෙකක් ද ඊට ඉහළින් මීටර් 15 ක් පමණ ඉහළින් තවත් මුරගල් දෙකක් ද දැකිය හැකිය. මෙම ස්ථානයේ මුරගල් යුගලය අතර පරතරය මීටර් 3.9 ක් වේ. මෙහි වූ මුරගලක පළල සෙ. මී. 45 ක් ද පසින් යටවී ඇති කොටසින් ඉතිරිව ඉහළට දැනට දක්නට ලැබෙන කොටසේ උස සෙ.මී. 18 ක් පමණ ද වේ. මෙහි පියගැට පන්තිය පසින් යට ව පවතින බව එක් ස්ථානයකින් ඉතා ම සුලු වශයෙන් ඉහළ මතු ව පවතින පියගැටයක් මගින් සනාථ වෙයි.



උතුරු පසින් පිහිටි පියගැට පන්තියට අයත් මුරගල් යුගලය

නැගෙනහිර බැවුම ඔස්සේ පර්වත මස්තකයට ප්‍රවේශවීම සඳහා යෙදූ පියගැට පන්තියෙහි දැනට පියගැට කිහිපයක් පමණක් ස්ථාන 2-3 ක පමණක් දක්නට ලැබේ. මෙම පියගැට පන්තියට අයත් පියගැටවලින් විශාල ප්‍රමාණයක් පසින් යටවී හෝ ගලවා ගෙන ගොස් ඇතැයි විශ්වාස කළ හැකිය. දැනට ඉතිරි ව ඇති පියගැට විශාල ගස්වල මුල්වලට හිරවී තිබෙන නිසා ඉහළ මතුවී ඇති බව පෙනෙන අතර, මෙම පිවිසුමෙහි මුරගල් දක්නට නොලැබේ. දැනට කොටස් වශයෙන් සහ සම්පූර්ණ පියගැට ලෙස හඳුනාගත හැකි පියගැට කිහිපයක් දක්නට ලැබෙන අතර සම්පූර්ණ පියගැටයක් ලෙස විශ්වාස කළ හැකි පියගැටයක දිග සෙ.මී. 165 ක් වේ.



නැගෙනහිර පසින් පිහිටි පියගැට පන්තියට අයත් පියගැට

සංඝාරාම සංකීර්ණයට ප්‍රවේශවීමට වූ පියගැට පන්ති සහිත ප්‍රවේශ මාර්ග ද්විත්වයෙන් ප්‍රධාන ප්‍රවේශය උතුරු දිශාවෙන් පිහිටන්නට ඇතැයි සිතිය හැකි වන්නේ මෙහි සංඝාරාම සංකීර්ණයෙහි වූ හඳුනාගත් ගොඩනැගිලි සියල්ල ම උතුරු ප්‍රවේශයට මුහුණලා ඇති බව පැහැදිලි ව පෙනෙන බැවිනි.

**ආරාමික ගොඩනැගිලි**

සංඝාරම සංකීර්ණයට අයත් ගොඩනැගිලි සහිත චතුරස්‍රාකාර මළුවේ සිට මීටර් 03 ක් පමණ පහළින් එම පූජනීය ගොඩනැගිලි සහිත මාලකය වටා දිවෙන තවත් මාලකයක් දක්නට ඇත. දෙවන මාලකය උතුරු, දකුණු සහ නැගෙනහිර දිශාවන්වලදී තරමක් එක සමාන පළලකින් යුක්තව කඳු ගැටය වටා ඒකාකාරී ලෙස දිවගිය ද බටහිර දිශාවේදී එය අනෙකුත් දිශාවන්ට සාපේක්ෂ ව තරමක් පළල් ව දිවයන බව පෙනේ. ආරාම පරිශ්‍රයේ අවශ්‍යතාවයන් සඳහා සැලසුම් සහගත ලෙස

සකස් කරන ලද මාලකද්වය මගින් ඉහළ මාලයේ වූ සංඝාරාමය ඉදිකිරීමේදී ඇතිවූ අවශ්‍යතා සපුරාලීම සිදුකරන්නට ඇත. මෙම දෙවන මාලයේ ද පැරණි ගොඩනැගිලි නටබුන් ලෙස හඳුනාගත හැකි සිටුවන ලද ගල්කණු සහිත ගොඩනැගිලි රාශියක් ම දැකගත හැකිය.



ආරාමික ගොඩනැගිලි

**වැව**

කුරුන්දි සංඝාරාම සංකීර්ණයට උතුරු දෙසින් මෙම වැව පිහිටා ඇත. ඉහළ මලුවට නැගීමට සකසා ඇති මුරගල් සහිත පියගැට පන්තියෙහි ආරම්භය වැව අසලට වැටී ඇති බව පෙනේ. උතුරු දකුණු දිශානුගත ව විහිදෙන වැව් බැම්මේ මධ්‍ය ප්‍රදේශයේ වැව් බැම්ම ඉදිරියෙන් ගලවා ගෙනඑන ලද හෝ පෙරළා දමන ලද පැරණි ගල් කණු කිහිපයක් ද වේ.



ආරාම සංකීර්ණය පාමුල පිහිටි වැව

## ගල් පාලම සහිත ගොඩැල්ල

උක්ත වැව් බැම්ම අවසානයේ ඒ අසල ම ගලා යන දිය පහරක් ආවරණය වන ලෙස තනා ඇති ගල් පාලමක් වැනි ඉදිකිරීමකි. නැගෙනහිර - බටහිර දිශානුගතව ඉදිකරන ලද පාලමෙහි පේළි දෙකකට දෙපසට කණු දෙක බැගින් කණු අටක් පිහිටා ඇත. ස්ථානයේ පෙරලුණු ගල් කණු හා ගල් පුවරු විශාල ප්‍රමාණයක් ද වේ. ගල් පාලමට නුදුරින් දිය පාර ආසන්නයේ පෙරළුණු ගල් කණු තුනක් දක්නට ඇත. ගල් පාලමෙහි එක් කෙලවරක කුඩා ගොඩැල්ලක් දක්නට ලැබෙන අතර ඇතැම් විට එය ගොඩනැගිල්ලක් තිබූ ස්ථානයක් ලෙස අනුමාන කළ හැකිය. ඒ අනුව එම පාලම එම ගොඩනැගිල්ලට පිවිසීම සඳහා තැනූ එකක් විය හැකි ය.



ගල් පාලම

## කුරුන්දි පුවරු ලිපිය

කුරුන්දි සෙල්ලිපියට අනුව උතුරු පළාතේ පැවති විහාරාරාමයක් පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි ය. 1889 කුරුන්දි විහාරය වෙත ගොස් ඇති ජේ. පී ලුයිස් මහතා එහි දී ඔහු විසින් දුටු සෙල්ලිපිය පිළිබඳව මෙසේ වාර්තා කර ඇත. - III මිහිඳු රජු (සම්මත වර්ෂ 801-804) (සුරවීර 1976 :114) තම මව සහ දියණිය සමඟ ඔහුගේ අටවන රාජ්‍ය කාලයේදී කුරුන්ගමට පැමිණ ඇති බව සඳහන් කර ඇත. එම වාර්තාවට අනුව මෙහි පැවති පුවරු ලිපිය ලංකාවෙන් හමුවන විශාල පුවරු ලිපිවලින් එකක් බවත් මෙහි බොහෝ කොටස් ඒ වන විට වියැකී තිබූ බවත් සඳහන් කර ඇත. සාමාන්‍යයෙන් මිහින්තලා පුවරු ලිපියෙහි සඳහන් ව ඇති නීති රීති, භික්ෂූන් වහන්සේලාගේ පොදු නීති රීති

වුවත් රජ තුමන් විසින් ඔහු විසින් ම අකුරු කොටා නීති රීති පනවා ඇති බවත් තවද එහි අකුරුවල වැරදි ඇතත් නිවැරදි නොකරන ලෙසත් එම නියෝග ක්‍රියාවට නගන ලෙසත් නියෝග කර ඇති බව එම ලිපියේ දැක්වෙන බව ඔහු සඳහන් කර ඇත. ඔහු එය දකින විටත් කැබලි 3 කට වෙන්ව තිබී ඇත. රුල්ගසා සකසා ලියා ඇති සෙල්ලිපිය වටා ගලෙහි මතු කරන ලද බෝඩරයක් දක්නට ලැබී ඇත (Lewis J.P 1895 : 314; September 13, 1889). මෙහි වූ ආරාවුල ජලය පිළිබඳව වන බවත්, ඊට හේතු වූ වැව කුරුඳුවැව හෙවත් තන්නිමුරිප්පු වැව ලෙසත් සී.ඩබ්ලිව්. නිකලස් මහතා අදහස් කරයි.

මෙහි සඳහන් විස්තරය අනුව මෙම සෙල්ලිපිය තිබී ඇත්තේ කන්ද මුදුනේ පුරාවිද්‍යාත්මක සාධක ඇති ස්ථානයේ නොව වැව පහළ පුරාවිද්‍යා සාධක ඇති භූමියේ ය. 1905 පුරාවිද්‍යා පාලන වාර්තාවෙහි එච්.සී.පී. බෙල් මහතා ඉහත සඳහන් කළ සෙල්ලිපිය තමා ට දැකගන්නට නොලැබුණු බව වාර්තා ගත කොට ඇත (Bell 1905 : 19).[7]

1949 පුරාවිද්‍යා පාලන වාර්තාවේ කුරුන්දි සෙල්ලිපිය පිළිබඳව මහාචාර්ය පරණවිතානයන් අදහස් දක්වා ඇත. මෙම සෙල්ලිපිය පිළිබඳව ලුවිස් විසින් පවසා ඇති කරුණු බලපත්‍ර සහිත සංචාරක මගපෙන්වන්නන් පැරණි නගර සංචාරයන්හි දී විදේශිකයන් හට පවසන බව දක්වා ඇත. 1931 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කුරුන්දි පුරාවිද්‍යා භූමිය පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා ගවේෂණයක් කළ නමුත්, එම අවස්ථාවේදී ලුවිස් මහතා හා පාකර් මහතා විසින් දක්වා ඇති සෙල්ලිපිය සොයාගැනීමට නොහැකි වී ඇත. ඉන් අනතුරුව 1933 දී කුරුන්දි භූමිය ලෙස ඒ අවස්ථාවේ හඳුනාගත් ප්‍රදේශය මැන පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ආචාර්ය සී.ඊ. ගොඩකුඹුර මහතා මෙම සෙල්ලිපිය පිළිබඳ ව සොයාබැලීමට ගොස් පසුව මෙම ප්‍රදේශයේ සංචාරයක යෙදී ඇත. ඔහු විසින් මෙම පුරාවිද්‍යා ස්ථානයේ ඇති පුරාවස්තු පසුගිය වසර කිහිපය තුළ නිදන් සෙවීමේ අරමුණෙන් විනාශකාරීන් විසින් විනාශ කර ඇති බව වාර්තා ගත කර ඇත. ඔහු විසින් සෙල්ලිපිය සොයාගෙන ඇති අතර එය කැබලිවලට කඩාබිඳ දමා තිබුණු බව වාර්තා කර තිබේ (ASCAR 1949:33).

පරණවිතාන මහතා මෙහිදී පෙන්වා දී ඇත්තේ පාකර් සහ ලුවිස් විසින් සෙල්ලිපිය රජතුමන්ම කොටා ඇති බව හා වැරදි අයුරින් අකුරුකොටා ඇති බවත් හා ඒ පිළිබඳව සමාව අයද සිට ඇති බවත් සඳහන් කිරීම විශ්වාස කළ හැක්කක් නොවන බවයි. එකල රජවරුන් හට සාහිත්‍යවේදීන්ගේ හිඟයක් නොතිබුණු බව පරණවිතාන මහතා තවදුරටත් පෙන්වා දී ඇත. මෙය පරීක්ෂා කර බලා ඔහු පවසා ඇත්තේ මධ්‍යකාලීන සෙල්ලිපියක් බව හා පාර්කර් පවසා ඇති පරිදි මෙය මිහින්තලේ පුවරු ලිපිය මෙන් නීතිමාලාවක් බව පවසා තිබීම පමණක් නිවැරදි බවයි (ASCAR 1949:33).

මෙම පුවරු ලිපිය මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා විසින් 2004 දී ප්‍රකාශයට පත් කර ඇත.

---

[7] The annual of the Vanni mentions a large slab inscription here, but I was unable to find it.

රාජ්‍ය කාලය : සිව්වන උදය (සම්මත වර්ෂ 946-954)

කාලය : සම්මත වර්ෂ 10 වන සියවස

අක්ෂර : මධ්‍ය කාලීන සිංහල

භාෂාව : මධ්‍ය කාලීන සිංහල

පෙළ

1) ............යස තෙදින් දස අත්හි පැතිරැ රජ කළ අභා සලමෙවන් මහරද්හු පුත්

2) ........මඬුල් රන්දනා රජලියෙහි මිණි වුටුනුයෙන් සිය මුනදුන් පැහැයූ ලක්දිව් පොළො යොන පරපු

3) රෙන් හිමිවූ තුමා සරණ නිය රසින් අන් රජ මුන්දුන් බිසෙස්වූ තික් තෙදින් හිරු පළැ කෙවින් මෙහෙසුරු දළ දැපින් උවින්දූ රජ විරිතින් සුරින්දු පබන්ද දෙනෙත් දිනිසුරු සත්

4) සෙතින් කිතිසුරු පැණ සරින් සුරගුරු සොම් ගුණෙන් නිසයුරු ..... නනි සරින් කප්තුරු රූ සරින් කදප් කුළුණු රෙසෙන් බොසතු මෙරුවන් සුව සරින් සම

5) ............ හුන් අභා සලමෙවන් මහරජ්හු තුමා සත් ලැගු පළමුවන හවුරුදුයෙහි ඇසෙළ පුත් සන්ද අවප් මස්හි දසපක් දව

6) ස් .......සඟඅරම් සිරිසග්බෝ රජ් මහවෙහෙර්හි වත් සිරිත් විසිනැ සියතන් සහ ... සසන්දා තුන් නකාහි මහසඟ් වත්හිමියන්

7) .............පස එවුන් වන සියෙනැ පතෙ පොතෙහි ඇරූ සෙයින් අකර්වනු ඉසා ........ සි හදව සිට පවත්නා කොට් මේ සිලාලෙඛ ..........

8) ............ සිරිසඟ්බො අබය මහරජ් අගසු(දා)ම් නම් වූ සඟ්බඩ් අප මැණියන් ඉසා ......... සිරිත් සන්දහා නියාමකින් ඉසා වරද්දෙවු පරෙයා ......

9) ..... කතු ඉසා ....... යා රක්රනුගම යුරෙහි අභයගිරි නකා පිළිබැඳි කොට් ස ....... කැරූ සඟරම් සිරිසඟ්බො රජ් මහවෙහෙරැ ක ..............

10) ............... නු කොට් අට්වනුයෙහි නවයැ සන්ද අවප් මසැ දියවක් දවස් දළදගෙහි ..... මෙ ........ රට් මෙ අඟය ඉසිරිපව් පියන්ගල් ක ....... කැමියන් ...

11) .......... තිස්සන් හා සසන්දැ මෙ වෙහෙරට් පියන්ගලට් තුබූ සිරිත් ඉසා විවරුණෙන් එක්සෙ කොට් තන් උවතකැ අර්වයි කැම් සැමියන් කළ විසිඑක් ..........

12) ........ එක් පැකක් අභයගිරි වෙහෙරැ ඉසා එක් පැකක් මෙ වෙහෙර්හි මහපහාහි ඉසා තබනු කොට් වදාළහ විම් කුසල්කැම් .... තබය සතු

13) ........ ගඟනෙහි සෙයින් මෙ නිසගින් සනිටිහන් වූ සිරිත් ඉසා මෙයට් දුන් කැබැලි කටයුතු සෙ ඉසහිය කටයුතුය ඉසා මිනිස්නට් කම් .........

14) ........ නට් ලබනු දිවයුතු සෙ ඉසා එක් සෙ කොටි අර්වයි මෙ වෙහෙරැ තබනු කොට් වදාළ සිරිත් පොත්හි ....... සිරිත් ලියි සත්දෙවාම් ලීම් මෙ වෙහෙරැ සිරිති මෙ වෙහෙර්හි වෙහෙ

15) ර්කැමියන් ..... කැමියන් පිළිමගෙහි සිරිත්පොත්හි කී සෙයින් බුද් බතට් ගත යුතු ඉසා පිළිමගෙහි එම පුද සිරිත් සෙයිමැ ........ කරනු ඉසා අනන්ද පියන්ගල්හි අ(ටි)න් දොළොසැ

16) .......පසැ ආවු වත්හිමියන් වැසි හිමියන් විසියා ..............................

17) .............................

18) ................................

19) ................................... (*Inscriptions of Ceylon*, Volume V, Part II, 221-224).



සෙල්ලිපියේ ස්පර්ෂ ලාංඡනය

මෙම සෙල්ලිපිය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ පාකර් හා ලුවිස් යන මහතුන් මෙම සෙල්ලිපිය වැරදි අයුරින් කියවා ඇති බව හෝ ඔහුන් විසින් කියවා දැක ඇත්තේ පසු කාලීනව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සොයා ගත් ඉහත සඳහන් සෙල්ලිපිය නොවන බවයි.





සෙල්ලිපිය සොයා ගැනීම

මෙහි දැක්වෙන ආකාරයට මෙම විහාර සංකීර්ණය අභය ගිරිවිහාරයට අනුබද්ධ විහාරයක් වේ. අභයගිරි විහාර "ඉසිරිපව් පියන්ගල" (පධානඝරය) යේ නිලධාරීන් සිදු කළ වතාවත් හා සිරිත් විරිත් සලකා බලා මෙම විහාරස්ථානයට අනුබද්ධ ව පැවති

සිරිත් විරිත් ද සලකා බලා කරුණු 21 කින් යුතු වත් පිළිවෙත් පොත්වල ලියා එකක් අභය ගිරි විහාරයේද අනෙක මෙහි මහා ප්‍රාසාදයේ ද තැන්පත් කරන ලෙස දක්වා තිබේ. මෙම පියන්ගලෙහි කටයුතු සිදු කිරීම පිළිබඳව නීති රීති හා පිළිමගෙයි සිරිත් විරිත් පිළිබඳ නීති රීති ඉර හඳ පවත්නා තුරු ඒ අයුරින් සිදු කළ යුතු බවත් සිදු කරන සියලු සිරිත් විරිත් පොත් පත් හී නිරන්තරයෙන් ලියා විහාරයේ තැන්පත් කළ යුතු බව ද සඳහන් වේ. මෙමගින් විහාරයේ නීතිරීති පිළිබඳව රජතුමන් විසින් දුන් අණකිරීමක් ලෙස මෙම සෙල්ලිපියෙහි දැක්වේ. මෙහි ඇති කරුණු සැලකිල්ලට ගත් කළ මෙහි සිදු කරන ලද පුද පූජාවන් නිසි අයුරින් සිදු කිරීමට අවශ්‍ය නීතිරීති රජතුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇති බව සඳහන් කළ හැකිය. මෙම සෙල්ලිපියෙහි සඳහන් කරුණු තවදුරටත් විශ්ලේෂණය කර පර්යේෂණයට ලක් කළ යුතුව ඇත. එසේ ම මෙහි වන බුදු මැදුර ද සුවිශේෂීත්වයකින් යුතු විශේෂ පුද පූජා පැවැත්වූ ස්ථානයක් බව සෙල්ලිපියෙහි ඇති කරුණු මගින් අනාවරණය වේ.

2020 වසරේදී කාලාන්තරයක් වනයේ සැඟව තිබූ මෙම සෙල්ලිපිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය (වව්නියා/මුලතිව්/මන්නාරම) මගින් සිදුකරන ලද ගවේෂණය මගින් සොයාගන්නා ලදී.

එය කොටස් වලට කඩා තැන තැන දමා තිබූ අතර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය නිලධාරීන්ගේ කැපවීම හේතුවෙන් සොයා ගන්නා ලදී. ලූවිස් මහතා කැබලි 03 ක් ලෙස දුටු පුවරු ලිපිය දැන් කොටස් 09 කින් යුතු වේ. බොහෝසෙයින් විනාශයට පත් ව ඇත.

මෙම සෙල්ලිපිය අධ්‍යයනය කිරීමේදී පෙනීයන්නේ පාකර් හා ලුයිස් කියවා ඇත්තේ වෙනත් ලිපියක් බවයි. එම ලිපියෙහි සඳහන් කරන පරිදි මෙම විහාර සංකීර්ණය හඳුන්වා ඇත්තේ අභයගිරි විහාරයට අයත් සංඝාරාමක් වන සිරිසඟබෝ රජ මහ විහාරය ලෙසයි. තුන්නිකායෙහි (මහාවිහාරය, අභයගිරිය, ජේතවනය) සංඝයා වහන්සේලාගේ එකඟත්වයෙන් රජු විසින් නියම කරන ලද නීති රීති සංඝයාට අදාල වන පරිදි සකස් කරන ලද කතිකාවතක් බව පෙනී යයි.

තවදුරටත් මෙම විහාරයට අයත් පධානඝරයක් හෙවත් භාවනා ශාලාවක් පිළිබඳව සඳහන් වෙයි. මෙම විහාරස්ථානයට අයත් පිළිමගෙය විශේෂ පුද පූජා, පවත්වන ස්ථානයක් බව මෙම සෙල්ලිපිය කෙටූ "සත්දෙව්" යන අය පවසයි.

මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා කියන පරිදි මෙම සෙල්ලිපිය සම්පූර්ණයෙන් ආරක්ෂා වී තිබුනානම් දිවයිනේ උතුරු පළාතෙන් ලැබුණු දහවන ශත වර්ෂයට අයත් ඉතා වැදගත් සෙල්ලිපියක් වනු ඇති බව පැහැදිලිවම සඳහන් කළ හැකිය. මෙම සෙල්ලිපිය කඩාබිඳ දමා තිබුණ ද එය ප්‍රසිද්ධ කිරීම ඉතා වැදගත්ය. එසේ වුවද එම සෙල්ලිපිය තර්කානුකූලව ගලපා ගත නොහැකි බැවින් ඉංග්‍රීසියට පරිවර්තනය කරනු නොලැබූ බව ඔහු සඳහන් කර ඇත. එසේ හෙයින් මෙය නැවත වරක් විමර්ශනය කළ යුතු බවත් එසේ කොට එම ලිපිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන සඟරාවේ (Epigraphia Zeylanica) පළ කිරීම සුදුසු බවත් පෙනී යයි.



කොටස් කිහිපයකට කැඩුණු සෙල්ලිපිය

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අභයවර්ධන, එච්.ඒ.පී. (1978) *කඩඉම් පොත් විමර්ශණය.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

අසංග, කල්ප සහ අයි.පී.එස්. නිශාන්ත (2018) *පෞරාණික ස්ථාන හා ස්මාරක-මුලතිව් දිස්ත්‍රික්කය.* කොළඹ 07: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

*උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීමේ හා සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණ වාර්තාව-2010.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

*ගුණසේන ශ්‍රී ලංකා සිතියම් පොත නව සංස්කරණය.* (2018) සීමාසහිත ඇම්.ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම: කොළඹ.

*දීපවංශය.* (1990) කිරිඇල්ලේ ඥාණවිමල හිමි (සංස්.). කොළඹ : එම්.ඩී. ගුණසේන සහ සමාගම.
නිකලස්, සී.ඩබ්. (1979) *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ස්ථාන විස්තරය.* සෝමපාල ජයවර්ධන (පරි.).

රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛා සඟරාවේ නව වෙළුමේ IV කාණ්ඩය

පරණවිතාන, සෙනරත්. (1986) *උතුරුකරයේ ආර්ය ජනාවාස.* අභය ආරියසිංහ (අනු.).

*පුරාවිද්‍යා පාලන වාර්තා, (1970-1977, 1979).* කොළඹ 07: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

*පැරණි ස්මාරක නාමාවලිය.* (1972) කොළඹ: සංස්කෘතික අමාත්‍යාංශය.

*මහාවංශය I කොටස.* (1963) හික්කඩුවේ සුමංගල සහ බටුවන්තුඩාවේ දේව රක්ෂිත (සංස්.). මරදාන:

*මහාවංශය, II කොටස.* (1963) හික්කඩුවේ සුමංගල සහ බටුවන්තුඩාවේ දේව රක්ෂිත (සංස්.). මරදාන:
*මුලතිව් දිස්ත්‍රික්ක මූලික ගවේෂණ වාර්තා (අදියර I, II, III) (අප්‍රකාශිත)*, කොළඹ 07: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

මැතිව්, සිරිල්. සී. (1981) *සිහලුනි බුදු සසුන බේරාගනිව්.* සේරුවිල පූජානගර සංවර්ධන සමිතිය.

මැතිව්, කලුවාදේවගේ සිරිල්. (1983) *ජාතිවාදී අහිතකර පූර්වමතියෙන්, නීති විරෝධී අත්පත් කර ගැනීමෙන් හෝ හිතාමතාම කරන විනාශ කිරීමෙන් උපද්‍රවයට ලක් වී ඇති, ශ්‍රී ලංකාවේ සංස්කෘතික වස්තු සම්පත් හානියෙන් බේරා සංරක්ෂණය කර තබා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් යුනෙස්කෝ ජගත් සංවිධානය වෙත ඉදිරිපත් කරන අභියාචනයකි.* අංක 101, බාන්ස් පෙදෙස, කොළඹ 07.

මෙධානන්ද හිමි, එල්ලාවල, (2003) *පාචීන පස්ස - උත්තර පස්ස - නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය.* කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

*ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය, 1 භාගය.* (1964) හේම් චන්ද්‍ර රාය (සංස්.), කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

*ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය, 11 භාගය.* (1972) හේම් චන්ද්‍ර රාය (සංස්.), කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
ලියනගමගේ, අමරදාස. (1989) *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය.* කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

*විමති විනෝදනී නාමන්තපාසාදිකාය විනයට්ඨකථාය ටීකා.* (1935) එච්. ගේබ්‍රියෙල් ද සිල්වා (සංස්.). කොළඹ: ලක්ෂ්මන් මුද්‍රණාලය.

වීරසිංහ, පී. (1981) *නාගයන්ගේ පා සටහන්,* වවුනියා දිස්ත්‍රික්කයේ පුරාවස්තු. කොළඹ: සුලලිත ප්‍රින්ට්.

සිරිසෝම, එම්.එච්. (1986) *උතුරු නැගෙනහිර පෙදෙස්හි හෙළ උරුමය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ.වී. (1987) *රාජාවලිය, විචාරාත්මක සංස්කරණය සහ ශාස්ත්‍රීය සංස්කරණය.* කොළඹ: අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Bell H.C.P, (1909) *Archaeological Survey of Ceylon: North-Central, Central, and Northern Province; Annual Report: 1905*. Ceylon: Government Printer, Colombo.

Bingham, P. M. (1921) *History of the Public Works, Department, Ceylon, 1796 To 1913,* Volume I. Colombo: Government Printer Ceylon.

Bingham, P. M. (1922) *History of the Public Works, Department, Ceylon, 1796 To 1896,* Volume II. Colombo: Government Printer Ceylon.

Bingham, P. M. (1923) *History of the Public Works Department, Ceylon, 1897 To 1913,* Volume III. Colombo: Government Printer Ceylon.

Bopearachchi, Osmund, (2014) "Sri Lanka and the Maritime Trade. Bodhisattva Avalokiteśvara as the Protector of Mariners." *In Asian Encounters: Exploring Connected Histories*. Upinder Singh and Parul Pandya Dhar (eds), London: Oxford University Press.
Deraniyagala, S.U. (1992) *Pre history of Sri Lanka. Vol. I,* Colombo : Archaeological Survey of Ceylon.

Dias, Malini. (1991) *Epigrapical Notes, Nos. 1-18*. Colombo: Department of Archaeology.

Dias, Malini. (2019) The Antecedents of Siṁhala in its Formative Era, *Journal of the Royal Asiatic Society of Sri Lanka*, New Series, Vol. 64 Issue I. Colombo: Royal Asiatic Society of Sri Lanka.

*History of the Department of Archaeology, Vol. I.* (1990) Nandadeva Wijesekara (eds). Colombo 07: Department of Archaeology.

Lewis, J.P. (1894) Archaeology of the Vanni, *Journal of the Ceylon Branch of Royal Asiatic Society Volume XIII.* H.C Cottie: Acting Government Printer.

Lewis, J.P. (1895) *The Vanni Districts (Vavuniya and Mullaittivu) of the Northern Province, Ceylon*. Ceylon: H.C. Cottle, Acting Govt. Printer.

Mudiyanse, Nandasena. (1967) *Mahayana Monuments in Ceylon*. Colombo: M.D. Gunasena.

National Atlas of Sri Lanka. (2007) Sri Lanka: Survey Department.

Nichalas, C.W. (1956) Historical Topography of Ancient and Medieval Ceylon, *The Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland New Series, Vol. 6 (1959).* pp. 1-197, Colombo: Royal Asiatic Society of Sri Lanka

Paranavitana, S. (1933) *Report of the Archaeological Survey of Ceylon for 1934.* Colombo: Ceylon Government Press.

Paranavitana, S. (1943) *Epigraphia Zeylanica, Vol IV*. London: Oxford University Press.

Paranavitana,S. (October 1950) *Report of the Archaeological Survey of Ceylon for 1949*. Colombo: Ceylon Government Press.

Paranavitana, S. (1989) *Epigraphia Zeylanica, Vol III (Reprint)*. Colombo: Archaeological Survey of Ceylon.

Paranavitana, S.(1983) *Inscription of Ceylon, Vol. II, Part I.* Colombo: Archaeological Survey of Ceylon.

Rahula, Walpola. (1956) *History of Buddhism in Ceylon, The Anuradhapura period 3rd Century BC-10th Century AC.* Colombo: M.D Gunasena & Co'LTD.

Ranawella, G.S. (2004) *Inscriptions of Ceylon, Vol. V, Part II*. Colombo: Department of Archaeology.

*Statistical Pocket Book – 2022 Sri Lanka*. Available at: http://www.statistics.gov.lk/Publication/PocketBook. (Accessed: 00 April 2023).

*District Statistical HandBook, Mullaitivu District (2021)*
Available at: http://www.statistics.gov.lk/ref/HandbookDictionary (Accessed: 00 April 2023).